2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂය - 401

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - විගණන වාර්තාව

පරිච්ඡේදය 05 - කාර්ය සාධක දර්ශක

පරිච්ඡේදය 06 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 07 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 08 - අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ‘‘රට හඳන සෞභාග්‍යයේ දැක්ම’’ තුළ හඳුනාගෙන ඇති දස වැදෑරුම් ප්‍රතිපත්ති මාලාවෙහි විශේෂ අවධානයක් යොමු කර ඇති ‘ගුණගරුක විනයගරුක නීතිගරුක සමාජයක්’’ (පිටු අංක 70-74) යන ප්‍රතිපත්තිය අනුව හා අංක 2187/27 හා 2020.08.09 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය සහ අංක 2194/74 සහ 2020.09.25 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය අංක 2202/25 හා 2020.11.20 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය මගින්, මෙම අමාත්‍යාංශය ස්ථාපනය කිරීම හා කාර්යභාරය නෛතික පැවරීම සිදු කර ඇත. ඒ අනුව ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, ජාතික ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පරිපාලන වගකීම පවරා ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ඇත.

1.2 දැක්ම

ජාතික උරුමයන් සංරක්ෂණය, සාහිත්‍ය සහ කලාව ප්‍රවර්ධනය තුළින් අභිමානවත් ශ්‍රී ලංකාවක්.

මෙහෙවර

ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, පාරම්පරික හා ග්‍රාමීය කලා ශිල්පී කටයුතු ප්‍රවර්ධනය කිරීමට සහය වීම සහ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමණාකරණය කිරීම සඳහා සහය වීම.

අරමුණු

1. ශ්‍රී ලාංකීය ජාතික උරුමයන් නෛතිකව හඳුනා ගැනීම හා ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම.
2. ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම.
3. ස්පර්ශනීය හා අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධනය.
4. දැයේ දරුවන් සහ තරුණයින් ඇතුළු ප්‍රජාව ජාතික උරුම සංරක්ෂණය හා සාරධර්ම පිළිබඳ දැනුවත් කිරීම.
5. සංස්කෘතික විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශනවල නිර්මාණශීලීත්වය හා විවිධත්වය පෝෂණය කිරීම.

6. සෑම ආයතනයකම පවත්නා ව්‍යවස්ථාපිත තත්වය හා නෛතිකව තහවුරු කිරීම හා යාවත්කාලීන කිරීම.
7. ආදිවාසි හා සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන්ගේ අයිතීන් සුරැකීම හා තෘප්තිමත් ජන කොටසක් බවට පත් කිරීම.
8. කලා ශිල්පීන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
9. දේශීය කලා නිර්මාණයන් ජාත්‍යන්තර ප්‍රජාවට විඳදනය කිරීමට අවස්ථාවන් හා පහසුකම් සැලසීම.
10. දේශීය කලා නිර්මාණ සංරක්ෂණය හා ප්‍රවර්ධනය හා ඉහළ ප්‍රමිතියකින් යුතුව ප්‍රජාවට විඳදනය කිරීම සඳහා පහසුකම් සැලසීම.
11. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමණාකරණය කිරීම.

1.3 සුවිශේෂී ප්‍රමුඛතාවන්

i. ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පවතින ආයතනවල ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
ii. මුද්‍රිත කෘති, නාට්‍ය, සිනමා, චිත්‍ර හා මූර්ති, සංගීත හා නර්තන කර්මාන්තයන් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම.
iii. දේශීයත්වය මුල්කරගත් කතෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
iv. අංග සම්පූර්ණ නාට්‍ය නිකේතනයක් ස්ථාපනය කිරීම හා කලාකරුවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ඒ සඳහා ආයතනික ව්‍යුහයක් සැකසීම
v. කලාත්මක නිර්මාණ සංරක්ෂණය සහ ප්‍රදර්ශනය සඳහා විශේෂිත පහසුකම් සැලසීම
vi. සම්ප්‍රදායික සහ නූතන නර්තන ශිල්පීන්ගේ ප්‍රාසාංගික ප්‍රදර්ශන අවකාශ ලබාදෙන සහ චිත්‍ර හා මූර්ති ශිල්පීන්ට ස්වකීය නිර්මාණ අලෙවි කර ගැනීමේ සංචාරක හෝටල් සහ සංචාරක ආකර්ෂණය සහිත ස්ථානවල ඉඩකඩ ලබාදීමේ වැඩපිළිවෙලවල් සංචාරක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කිරීම
vii. නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමණාකරණය සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකාය සමඟ සම්බන්ධීකරණය

1.4 සංවිධාන සටහන


ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
ගරු රාජ්‍ය අමාත්‍යතුමා
අමාත්‍යාංශ ලේකම් SLAS (Super Grade)
අතිරේක ලේකම් SLAS (Super Grade)
අධ්‍යක්ෂක (ක්‍රමසම්පාදන) SLPS i
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) SLAS i
ප්‍රධාන ගණකාධිකාරී SLACS i
නියෝජ්‍ය අධ්‍යක්ෂක (ක්‍රමසම්පාදන) SLPS ii/iii
සහකාර ලේකම් SLAS ii/iii
ගණකාධිකාරී SLACS ii/iii
පරිපාලන නිලධාරි
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි Supra
සංවර්ධන නිලධාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සේවා නිලධාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සේවා නිලධාරි
රියදුරු
කාර්යාල කාර්ය සහාය සේවක

1.5 පරිපාලන වගකීම් පැවරී ඇති ආයතන

1. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
2. ටවර් හෝල් රඟහල පදනම
3. ශ්‍රී ලංකා කලා මණ්ඩලය
4. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය
5. ගාලු උරුමය පදනම
6. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය
7. ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය **(**නෙළුම් පොකුණ**)**
8. කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් වූ ව්‍යවස්ථාපිත මණ්ඩලය
9. අපේ ගම

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

අමාත්‍යාංශයේ විශේෂ ජයග්‍රහණ - 2021 වර්ෂය

රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කළ වැඩසටහන්.....

අපගේ රාජ්‍ය අමාත්‍යාංශයේ වගකීම වනුයේ "ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, ජාතික ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමයි. ඒ අනුව මෙම අමාත්‍යාංශය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වර්ෂය තුළදි විශේෂ අවධානය යොමු කරමින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත. වැඩසටහන් හා ව්‍යාපෘති කිහිපයක් සෘජුවම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර අමාත්‍යාංශයට 2021 වර්ෂය සඳහා වෙන් වී තිබූ ඉතාම සීමිත ප්‍රතිපාදනය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කිරීම සිදු කරන ලදි.

- **ජාතික උරුම හඳුනාගැනීම සහ සංරක්ෂණය සඳහා තිරසාර වැඩපිළිවෙලක්.....**

“ජාතික උරුම නිශ්චිතව තීරණය කිරීම හා හඳුනා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීම”සඳහා සාමාජිකයින් හත් දෙනෙකුගෙන් යුත් අන්තර් නියාමන කමිටුවක්”

ජාතික උරුම හඳුනා ගැනීම හා සංරක්ෂණය කිරීම සඳහා වන දිගුකාලීන අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා විශේෂිත වූ ක්‍රමවේදයක් නොමැතිවීම මෙම ක්ෂේත්‍රය තුළ පැවති විශාල හිඩැසකි. මෙම තත්වයට තිරසාර විසඳුමක් වශයෙන් **පර්යේෂණ හා සංරක්ෂණ ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා වන යෝජනා හා නිර්දේශ ලබා ගැනීමට පත් කරන ලද** විද්වත් කමිටුව විසින් සකස් කරන ලද වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට හැකි වීම විශාල ජයග්‍රහණයකි. එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික උරුම පර්යේෂණ හා සංරක්ෂණ ඒකකය ස්ථාපිත කරන තෙක් ශ්‍රී ලංකාවේ ජාතික උරුම නිශ්චිතව තීරණය කිරීම හා හඳුනා ගැනීමට සුදුසු ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීම”සඳහා සාමාජිකයින් හත් දෙනෙකුගෙන් යුත් අන්තර් නියාමන කමිටුවක් පත් කිරීම ඉදිරියේ දී සිදු කෙරේ.

ඒ අනුව විද්වත් කමිටු වාර්තාව ප්‍රකාරව ශ්‍රී ලාංකිකයින් සතු ජාතික උරුමයන් හඳුනා ගැනීම, ලේඛනගත කිරීම, ප්‍රකාශයට පත් කිරීම, අභිරක්ෂණය, නියාමනය, අත්පත් කර ගැනීම, ඒ පිළිබඳ පර්යේෂණ පවත්වාගෙනයාම සහ පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම යන ක්‍රියාවන් ඇතුළත්ව ශ්‍රී ලංකාවේ ජාතික උරුමය නිසි පරිදි කළමණාකරණය සඳහා නාභිගත වූ විධිමත් වැඩ පිළිවෙලක් සකස් කෙරෙනු ඇත.

❖ ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම මගින් නව ප්‍රබෝධයක්.....

ශ්‍රී ලංකාවේ ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය (Tangible & Intangible) ජාතික උරුම දේශීය හා විදේශීය ප්‍රජාව වෙත වඩාත් ආකර්ෂණීය හා ඵලදායි ලෙස සන්නිවේදනය කිරීම තුළින් ජාතික උරුම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මේ වන විට ව්‍යාපෘතිය යටතේ,

- ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය උරුම උරුම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම සඳහා වන ඩිජිටල් යෙදුම (Digital App) නිර්මාණය කිරීම අවසන් කර ඇත. එම ඩිජිටල් යෙදුමට (Digital App) ඇතුළත් කිරීම සඳහා අස්පෘශ්‍ය ජාතික උරුම ඇතුළත් වීඩියෝ පට 30 නිර්මාණය කිරීම සිදු කර ඇත. මෙමගින් ජාතික උරුම සංරක්ෂණ සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම ප්‍රායෝගිකව යොදා ගැනේ. ස්මාර්ට් ජංගම දුරකතන වැඩි වශයෙන් භාවිතා කරන නූතන පරම්පරාව තුළ එම තාක්ෂණය හරහාම මෙම ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් සහ අවබෝධයක් ඇති කිරීම සිදු වේ.
- උරුම ප්‍රවර්ධනය සඳහා ‘‘දෙකෝටියක උරුමයේ දායාදාගාරය’’ තේමාව යටතේ තේමා ගීත දෙකක් නිර්මාණය කර ඇත.
- අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම අවසන් කර ඇති අතර මේ වන විට එහි වැඩි දුර සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී. www.heritage.gov.lk මගින් අමාත්‍යාංශ නිල වෙබ් අඩවියට පිවිසිය හැකිය.





❖ කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම .....

විවිධ කලා ක්ෂේත්‍ර තුළ නියැලෙන කලාකරුවන් හා ශිල්පීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නොතිබීම මෙරට කලා ක්ෂේත්‍රය තුළ තිබූ විශාල අඩුවකි. එයට පිළියමක් ලෙස සියලුම කලා ක්ෂේත්‍ර හා කලා ශිල්ප ආවරණය වන පරිදි දිවයිනේ විවිධ ප්‍රදේශවල විසිරී සිටින කලාකරුවන්ගේ අංග සම්පූර්ණ තොරතුරු ඇතුළත් කළ හැකි දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ කාර්යය අවසන් කර ඇත. මෙමගින් මෙරට සිටින කලාකරුවන් හා ශිල්පීන්ගේ තොරතුරු දේශීයව හෝ විදේශීය වෙසෙන සේවාලාභීන් සඳහා පහසුවෙන් ලබා ගැනීමටත් අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදු කර ගැනීමටත් හැකි වන අතර එය කලාකරුවන් අතර අන්තර් සම්බන්ධතා වැඩි දියුණු කර ගනිමින් එය ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා යොදා ගත හැකිය.





❖ කලාකරුවන් සඳහා Digital App නිර්මාණය කිරීම.....

මෙරට වෙසෙන සියලුම ක්ෂේත්‍ර නියෝජනය කරන කලාකරුවන් හට සිය නිර්මාණ ඇතුළත් කිරීම මගින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වෙළඳපොල අවකාශ නිර්මාණය කර ගැනීම සඳහා කලාකරු Digital App නිර්මාණය අවසන් කර ඇත. මෙම කලාකරු පරිගණක යෙදුම කලාකරු දත්ත පද්ධතිය හා සමගාමීව ක්‍රියාත්මක කෙරේ. මේ සඳහා 2021 වර්ෂයේ දී රු.මි. 4.5 ක් වැය කරන ලද අතර ඉදිරියේ දී මෙය පුළුල් මාර්ගගත වෙළඳපොලක් ලෙස වැඩි දියුණු කිරීමට සූදානම් වේ.





❖ කලාකරුවන්ට හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් ....

මෙරට කලා ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන බොහෝ කලාකරුවන්ට ස්ථීර ආදායම් මාර්ගයක් නොමැති අතර බොහෝ කලාකරුවන් ජීවිකාව පවත්වා ගනු ලබන්නේ ඉතා අසීරු ලෙසය. එවන් කලාවකවානුවක කලාකරුවන් උදෙසා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම අත්‍යාවශය කර්යයකි. ඒ අනුව ග්‍රාමීය කලා ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛතාවය ලැබෙන පරිදි සමස්ථ දිවයිනම ආවරණය කරමින් පළමු අදියරේ දී කලාකරුවන් 550 ක් සඳහා වෛද්‍යාධාර හා හදිසි අනතුරු රක්ෂණාවරණයක් පිරිනැමෙන අතර එම වැඩ සටහන ඉදිරිවර්ෂ තුළ වඩා වැඩි කලාකරුවන් පිරිසකට ප්‍රතිලාභ ලබාදිය හැකි වන පරිදි ක්‍රියාත්මක කෙරේ. 2021 වර්ෂයේ දී මේ සඳහා රුපියල් මිලියන 9.9 ක මුදලක් වැය කර ඇත.





❖ ආදී වාසි ජන උරුමයන් ආරක්ෂා කිරීම.....

මෙරට ජීවත් වන ආදිවාසී / විශේෂ අනන්‍යතාවන් සහිත ජන කණ්ඩායම් කෙරෙහි වන යුතුකම් ඉටුකිරීම අත්හල නොහැකි වගකීමක් ලෙස අප වටහා ගෙන ඇත. ඒ අනුව ඒ සඳහා වූ සුවිශේෂ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදි.

දඹාන ජන උරුම කේන්ද්‍රයේ අස්ථි ප්‍රදර්ශන මැදිරිය ස්ථාපිත කිරීම මෙහිලා සිදු කරන ලද සුවිශේෂී කාර්යයකි. විවිධ කාල වකවානු තුළ දී විදේශිකයින් විසින් මෙරටින් ගෙන ගොස් විදේශීය කෞතුකාගාරවල තැන්පත් කර තිබූ අස්ථි කොටස් හා හිස් කබල් නැවත මෙරටට ගෙනවිත් ඒ වෙනුවෙන්ම ප්‍රදර්ශන මැදිරියක් ස්ථාපිත කර ඇත.





❖ ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම.....



දඹාන ජන උරුම කේන්ද්‍රයේ අස්ථි ප්‍රදර්ශන මැදිරිය නැරඹීමට පැමිණෙන පිරිස් හට ආදිවාසින් පිළිබඳ ඉතිහාසගත තොරතුරු කරා පහසුවෙන් ප්‍රවේශ විය හැකි වන පරිදි නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් කියොස්ක් තොරතුරු පද්ධතියක් (Kiosk Information System) ස්ථාපනය කිරීමේ කටයුතු ද මේ වන විට අවසන් කර ඇත.

එමෙන්ම මේ වන විටත් විදේශීය කෞතුකාගාරවල තැන්පත් කර ඇති මෙරට විසූ ආදිවාසී ප්‍රජාවන්ගේ හිස්කබල්, අස්ථි කැබලි, භාවිත උපකරණ වැනි දෑ නැවතත් මෙරටට ලබා ගෙන සංරක්ෂණය කිරීම සඳහා වන මූලික සාකච්ඡා ආරම්භ කර ඇත.

එමෙන්ම දඹාන, රතුගල, හෙනානිගල යන ආදිවාසී ගම්මාන කේන්ද්‍ර කර ගනිමින් ආදිවාසී ප්‍රජාවගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා එම ගම්මාන අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලද සහාය ඇතිව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදි.

- හෙනානිගල ආදිවාසි කෞතුකාගාර පරිශ්‍රය නඩත්තුව සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම හා කෞතුකාගාර පරිශ්‍රයේ ඉලුක් නිවාස වල වහලය අලුත්වැඩියාව එහි වැට දැල් යොදා සකස් කිරීම සහ ආරක්ෂිත ගේට්ටුවක් සවිකිරීම.
- රතුගල ආදිවාසි ගම්මානයේ ආදිවාසි ළමුන් සඳහා ආදිවාසි භාෂාව ඉගැන්වීමේ වැඩ සටහනක් ආරම්භ කරන ලද අතර ළමුන් 50 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් මේ සඳහා සහභාගී විය.
- දඹාන ජන උරුම කේන්ද්‍රයේ ගොඩනැගිලිවල වහලයන් ඉලුක් යොදා ප්‍රතිසංස්කරණය කිරීම.
- කෞතුකාගාරයේ බිත්තිවල මැටි ආලේප කිරීම හා අනෙකුත් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම.





❖ ප්‍රසිද්ධ කලාකරුවන් ආශ්‍රය කරගත් ග්‍රාමීය කලා ගම්මාන .....

සමාජය තුළ නිසි ඇගයීමට ලක් නොවූ නමුත් කලා ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සුවිශේෂී දායකත්වයන් සපයන ලද ග්‍රාමීය කලාකරුවන් හඳුනාගෙන ඔවුන් ජීවත් වූ ප්‍රදේශයේ ඇති පුස්තකාල, කලාගාර වැනි දේ නවීකරණ කර ඔවුන් නමට පැවරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු වේ. මෙම වසර තුළ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රවීන කලාකරුවකු වන ආර්.ජී.එච්.එස් රත්න කුමාර මහතා වෙනුවෙන් දුටුවැව මහා විද්‍යාලයේ සෞන්දර්යය ඒකකය ස්ථාපනය කිරීම නිම කොට ඇත.

හඳපාන්ගොඩ නැට්ටුක්කාර නැකතිගේ සේදරමන් ප්‍රනාන්දු කලාකරුවා නමින් ඉදි කරන ලද කලාගාරයේ වැඩ අවසන් කර ඇත.

මෙම ව්‍යාපෘති දෙක සඳහා රු.මි.9.1 වැය කරන ලදි.





❖ දේශීයත්වය මුල් කරගත් කතෘභාග ගෙවීමේ පිළිගත් ක්‍රමවේදයක්....

මෙරට කලා ක්ෂේත්‍රයන් සඳහා නීතිමය පසුබිමක් යටතේ නිර්මාණකරුවාට කර්තෘ භාග ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව පිළිගත් ක්‍රමවේද යටතේ අවශ්‍ය සහය ලබාදීමට මෙම ව්‍යාපෘතිය දියත් කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් නිර්මාණයේ සැබෑ හිමිකරුට නිර්මාණය භාවිතා කරන සෑම අවස්ථාවකදීම ඊට අදාළ කර්තෘ භාගය ලබා දීම, වෘත්තීය මට්ටමින් පිළිගැන්වීමක් ලබාදීම, කලාකරුවා ප්‍රවර්ධනය කිරීම, ආර්ථික වශයෙන් ජීවන තත්වය ඉහළ දැමීම බලාපොරොත්තු වේ.

- දිස්ත්‍රික් මට්ටමෙන් ලේඛක සංවිධාන පිහිටුවා අවසන් කර ඇති අතර ඔවුන් සමූහික සංගම් ලෙස බලගැන්වීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.
- ජාතික නර්තන සංවිධානය පිහිටුවීමේ කාර්යය සිදු කෙරෙමින් පවතී.
- ඡායා රූප ශිල්පීන්ගේ ජාතික සංවිධානය පිහිටුවීමේ කටයුතු ආරම්භ කර ඇත.

❖ දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන (දැනුවත් කිරීමේ වැඩසටහන).....

අතීත කලා නිර්මාණ පෙන්වීම මඟින් පාසල් ළමුන්ගේ රසඥතා ශක්තිය දියුණු කර ගැනීමට අවශ්‍ය කරන පසුබිම සැකසීම, කලාව කෙරෙහි දරුවන් තුළ ඇල්මක් ඇති කිරීම, දැයේ උරුමයන් පිළිබඳ දැනුම වර්තමානයට මෙන් ම අනාගතයට කෙතරම් වටින්නේ ද යන්න පසක් කර දීම හා ඒවාට ආදරය කරන දරු පරපුරක් නිර්මාණය කිරීම, අනාගත පරම්පරාව උදෙසා ලාංකේය උරුම සංරක්ෂණය කිරීම යනාදිය මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය යටතේ පිරිවෙන්වල ඉගෙන ගන්නා දරුවන් හේවිසි වාදනය සඳහා පුහුණු කිරීම මේ මඟින් සිදු කෙරේ.

❖ දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන දරුවන්ගේ කලා රසඥතාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.....

මෙම ව්‍යාපෘතිය යටතේ සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් පිරිවෙන් 102 ක් සඳහා හේවිසි වාදන භාණ්ඩ කට්ටල ලබා දී ඇත. දහම් පාසල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමාගේ ඉල්ලීමට අනුව දැනට නර්තන විෂය උගන්වන පිරිවෙන් සඳහා ගැට වෙර 54ක් බෙදා දී ඇත. දහම් පාසල් සඳහා ඉතිරිව ඇති ප්‍රතිපාදන උපයෝගි කරගෙන තවත් හේවිසි භාණ්ඩ කට්ටල 4ක් සහ ගැට බෙර 4ක් ලබා දී ඇත. මේ සඳහා වැය කරන ලද මුදල රු.මි. 3.1 කි.

❖ ආකල්ප සංවර්ධනය පුහුණු වැඩසටහන්.....

මෙම අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශ යටතට ගැනෙන ආයතනවල ඵලදායිතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා විදිමත් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ඇති අතර එහි පළමු අදියර ලෙස අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් සඳහා එක් දින වැඩමුළු 05ක් පවත්වා ඇත. අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන වල ප්‍රධානීන් සඳහා එක් වැඩමුළුවක් පවත්වා ඇත.

එමෙන්ම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සියලුම නිලධාරීන් සඳහා ද ආකල්ප සංවර්ධනය වැඩමුළු 2022 වර්ෂයේ දී පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

අමාත්‍යාංශ විෂය පථයට අයත් ආයතන 2021 අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණ

2.1 ටවර් හෝල් රඟහල පදනම

❖ **ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණාවරණය** මගින් නාට්‍ය ක්ෂේත්‍රයේ කලාකරුවන් 500 ක් සඳහා ප්‍රතිලාභ ලබා ඇත. නාට්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මෙවැනි මැදිහත්වීමක් සිදු කරන ලද්දේ පළමු වතාවට වීම විශේෂත්වයකි. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2021.03.16 දින අරලියගහ මන්දිරයේ දී රක්ෂණ ඔප්පු පිරිනමන ලදී. මේ වන විට රුපියල් මිලියන 4 කට වඩා වැඩි ප්‍රතිලාභ කලාකරුවන් වෙත මෙම රක්ෂණ යෝජනාක්‍රමය මගින් පිරිනමා ඇත.



❖ ප්‍රාසාංගික කලාකරුවන් සඳහා වන ජනාධිපති සුභසාධක අරමුදල (PWF) මගින් විවිධ කලා ක්ෂේත්‍රයට අමිල මෙහෙවරක් ඉටු කරන ලද වයෝවෘද්ධ කලාකරුවන් 91 දෙනෙකු සඳහා මසකට රු.7500/- බැගින් දීමනාවක් පිරිනැමේ.



❖ **ටවර් ශිල්පීන් සඳහා දීමනා ලබාදීම වැඩසටහන යටතේ** වයෝවෘද්ධ කලාකරුවන් 50 දෙනෙකු සඳහා මසකට රු.7500/- බැගින් දීමනාවක් පිරිනැමේ වැඩසටහන.

❖ නාට්‍ය නිෂ්පාදන සඳහා ආධාර ලබා දීමේ වැඩසටහන යටතේ නාට්‍ය ක්ෂේත්‍රයේ විවිධ අංශ නියෝජනය කරන තරුණ අංකුර නාට්‍ය ශිල්පීන් 50 දෙනෙකුගේ සෘජු සහභාගීත්වයෙන් බර්ටෝල් බ්‍රෙෂ්ට්ගේ "ත්‍රිපෙනි" ඔපෙරා පරිවර්තන නාට්‍ය නිෂ්පාදනය කරන ලදි.



❖ නාට්‍ය පාසැල වැඩසටහන යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමග ඒකාබද්ධ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරන "අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා (විශේෂ) උපාධි" වැඩසටහනෙහි නාට්‍ය හා රංගකලා දෙවර්ෂ පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා නවක සිසුන් 90 දෙනෙකු බඳවා ගන්නා ලදි. 2021.04.21 දින මරදාන එල්ෆින්ස්ටන් රඟහලේ දී අධ්‍යයන වර්ෂ 2020/2021 සඳහා නවක සිසුන් බඳවා ගැනීමේ උත්සවය පැවැත්විණි.



❖ නාඩගම්, නාට්‍ය හා නූර්ති ගී සංරක්ෂණය සඳහා සංයුක්ත තැටි නිෂ්පාදනය යටතේ පැරණි දුර්ලභ නාඩගම් ගී 16ක් නියමිත රාගතාල අනුව සංගීතවත් කර නාඩගම් ගී පිළිබඳ විෂය ප්‍රමාණික සංගීතඥයන්ගේ උපදේශකත්වයෙන් සවිසිරිපාය ශබ්දාගාරයේ දී පටිගතකර පිටපත් 1000ක ශ්‍රව්‍ය සංයුක්ත තැටි නිෂ්පාදනයටත් අන්තර්ජාල සමාජ මාධ්‍ය ඔස්සේ විකාශනය කිරීමටත් සූදානම් කර ඇත.



- ❖ සිංහල නාට්‍ය පිටපත් දෙමළ භාෂාවට පරිවර්ථනය කිරීමේ වැඩසටහන යටතේ ප්‍රවීණ නාට්‍යවේදී නැසීගිය සෝමලතා සුබසිංහ මහත්මියගේ ළමා නාට්‍ය පිටපත් 02ක් දෙමළ භාෂාවට පරිවර්තනය කර පිටපත් 1000 බැගින් ප්‍රකාශනයට පත් කර ඇත.
- ❖ උත්තර භාරතීය සංගීතය (ගායන සහ වාදන), කථක්, භරතනාට්‍යම් නර්තන විශාරද විභාග දක්වා විභාග අපේක්ෂකයන් 96 දෙනෙකු ඉන්දියානු විභාග සඳහා යොමු කර ඇත.
- ❖ කලාකරුවන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය.

2.1 ශ්‍රී ලංකා කලා මණ්ඩලය

ආයතනය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වර්ෂය තුළ දී විශේෂ අවධානය යොමු කරමින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

❖ අස්පර්ශ සංස්කෘතික උරුමය දිවයින පුරා ප්‍රචලිත කිරීම

ශ්‍රී ලංකා කලා මණ්ඩල විසින් ප්‍රකාශනයට පත් කරන ලද ශ්‍රී ලාංකේය අස්පර්ශනීය ජාතික උරුමයන් ලෙස සැලකෙන විවිධ සාම්ප්‍රදායික නාට්‍ය හා ශාන්තිකර්ම විධීන් විදහා දැක්වෙන ග්‍රන්ථ 17ක් , බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ යුතු නියමිත මානක විධි ඇතුළත් "බුද්ධ ප්‍රතිමා නිර්මාණ කලාව" ග්‍රන්ථය හා "කලා සහරාව" ජන ගත කිරීමේ නිල උත්සවය ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු විදුර වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2021 අගෝස්තු 10 වන දින අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පවත්වන ලදී. එහිදී ග්‍රන්ථ 18ක් ජනගත කරන ලදි.

- **ශාස්ත්‍රීය ප්‍රතිමා මානක විධි සහිත බුද්ධ ප්‍රතිමා නිර්මාණ කලාව**
- **අපේ උරුමය 01 - සොකරි නාටකය**
- **අපේ උරුමය 02 - කෝලම් නාට්‍ය සම්ප්‍රදා**
- **අපේ උරුමය 03 - රූකඩ නාට්‍ය කලාව**
- **අපේ උරුමය 04 -නාඩගම් කලාව**
- **අපේ උරුමය 05- නූර්ති රංග කලාව**
- **අපේ උරුමය 06-රිද්දියාගය**
- **අපේ උරුමය 07 - සන්නියකුම**
- **අපේ උරුමය 08- සූනියම් කැපිල්ල**
- **අපේ උරුමය 09- මහසෝන් සමයම**
- **අපේ උරුමය 10-බෙරවාදන කලාව**
- **අපේ උරුමය 11-කෝල්මුර යාගය**
- **අපේ උරුමය 12-ගම්මඩු ශාන්තිකර්මය**
- **අපේ උරුමය 13-කොහොඹා යක් කංකාරි**
- **අපේ උරුමය 14-කුමාර සමයම**
- **a. අපේ උරුමය 15-පහන්මඩු ශාන්තිකර්මය**
- **b. අපේ උරුමය 16-බලි ශාන්තිකර්මය**
- **c. අපේ උරුමය 17-කිරිමඩු ශාන්තිකර්මය**



- ❖ අවුරුදු 100 වයසැති දක්ෂිණ දේශයේ නර්තන කලාවේ උන්නතිය සඳහා මහඟු මෙහෙවරක් සිදු කළ ලැබුනා පේදුරු ඩැනී කලාකරුවානන් අගයමින් කලා මණ්ඩල මගින් රු. 50,000ක මුදලක් 2021 අප්‍රේල් 07 දින පරිත්‍යාග කරන ලදී.
  සොකරි නාටකය රහදැක්වීම බණ්ඩාරවත්ත, මැණික්කඩවර, තුංතොට දී 2021 අප්‍රේල් මස 09 දින සාර්ථක අයුරින් පවත්වන ලදී.

2.3 ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය



මෙම ආයතනය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වර්ෂය තුළ දී විශේෂ අවධානය යොමු කරමින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

- සියලු ම පාඨමාලාවන්හි ප්‍රතිඵල කටයුතු අවසන් කර ඇති අතර අදාළ විෂය නිර්දේශය NAITA ආයතනය මඟින් වලංගු (Validate) කර TVEC ආයතනය හරහා ප්‍රතිඵල කටයුතු අවසන් කර ඇත.
- අභ්‍යාසලාභීන් සඳහා සහ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ නව පාඨමාලාවක් ලෙස පන්සල් චිත්‍ර සංරක්ෂණ කෙටිකාලීන පාඨමාලාවක් ආරම්භ කිරීම.
- ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය සතු ගොඩනැගිලි නවීකරණය කිරීම යටතේ සංගීත අධ්‍යන ගොඩනැගිල්ල, නිල නිවාස, පිරිමි නේවාසිකාගාරයේ මුළුතැන්ගෙය නවීකරණ කටයුතු මේ වන විට අවසන් කර ඇත.



- ජනකලා කේන්ද්‍ර භූමියේ කාණු පද්ධතිය විධිමත් පරිදි අලුත්වැඩියා කිරීම ශිෂ්‍ය නේවාසිකාගාරවල සහ කාර්යාල පහසුකම් වැඩි දියුණු කිරීම අවසන් කර ඇත.

2.4 ගාලු උරුමය පදනම

- **සඳු උරුම ගැලරියේ ඉතිරි සංවර්ධන කටයුතු අවසන් කර ඇති අතර** කොටුව, කොටුව හා බැඳුණු පෞරාණික වටිනාකම ප්‍රවර්ධනය වන ලෙස ස්ථාපනය කරන ලද ළමා සිතුවම් ගැලරිය මෙම වසර අවසානයේ මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත වීමට නියමිතය.
- **ගාලු කොටුවේ පැරණි ඇලි වීදි සංවර්ධනය කිරීම වැඩ අවසන් කර ඇති අතර** දෙස් විදෙස් සංචාරකයින්ට හා ප්‍රජාව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය, සෞඛ්‍ය ආරක්ෂිත නගරයක් ඇති කිරීම හා ආරක්ෂාව තහවුරු කිරීම තුළින් ගාලු කොටුව සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීමට පියවර ගනිමින් ඇත.





➢ **ගාලු උරුමය පදනමේ කාර්යාලීය සංවර්ධන කටයුතු**



- කොටුව තුළ දෙස් විදෙස් සංචාරකයින්ට හා ප්‍රජාවට සේවය සලසන, නියාමනය කරන ප්‍රමුඛ ආයතනයක් ලෙස එහි කාර්ය මණ්ඩලය හා සේවාලාභීන්ට යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම.
- ගාලු උරුමය පදනමේ කාර්ය මණ්ඩලයට සහ සේවාලාභීන්ට පාවිච්චියට සුදුසු වැසිකිළි කැසිකිළි පද්ධතියක් ඉදිකිරීම.



- ආයතනයේ වැසිකිළියේ ජල සම්පාදනය අක්‍රිය තත්වයේ පැවති අතර, ජල මෝටරයක් සවිකර ජල සැපයුම සක්‍රීය තත්වයට පත්කර ඇත.
- තොරතුරු මධ්‍යස්ථානයේ පැති ගල් බැම්ම සහ ආරක්ෂිත වැට ඉදිකිරීම. කාර්යාලීය ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියාව, බිත්ති අලුත්වැඩියාව (හුණු පිරියම් කිරීම), පොළව ගල්පතුරු ඇල්ලීම.

➢ **පොලිස් නිල නිවාසයේ භුක්තිය ගාලු උරුමය පදනමට පවරා ගැනීම** අප ලබාගත් සුවිශේෂී ජයග්‍රහණයකි. මෙය සංවර්ධනය කර ආදායම් උත්පාදනය කරන ව්‍යාපෘතියක් ලෙස භාවිතා කිරීමට අපේක්ෂා කරන අතර, මෙමගින් මාසිකව රුපියල් ලක්ෂ 12ක පමණ බදු කුලියක් උපයාගත හැකිය. එබැවින් මහා භාණ්ඩාගාරයට පැවරෙන වැයබර ඉදිරියේ දී සැලකිය යුතු මට්ටමකින් අඩු කර ගත හැකිය.

ගාලු කොටුව තුළ ස්ථාන දෙකක විස්තරාත්මක ෆයිබර් සිතියම් දෙකක් ස්ථාපනය කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර මෙමගින් දෙස් විදෙස් සංචාරකයින්ට හා සංචාරක මඟපෙන්වන්නන්ට නිවැරදි දැනුම හා තොරතුරු ලබාදීමේ ක්‍රමවේදයක් ඇති කිරීම මෙහි අරමුණ වේ.

2.5 මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානය



➢ උද්‍යානය තුළ විශාල දර්ශන පසුතලයක් ලෙස භාවිතා කරන ජම්බුගස්වැව අදියර හතරක් යටතේ ප්‍රතිසංස්කරණය කෙරෙන අතර මෙම වසර තුළ එහි පළමු අදියර සඳහා රු. මි. 10 වෙන් කර ඇති අතර ව්‍යාපෘතිය මෙම වසර අවසන් වන විට ටෙලි සිනමා නිර්මාණ සඳහා ප්‍රශස්ථ මට්ටමේ දර්ශන පසුතලයක් ලෙස වැඩි දියුණු කෙරේ. මේ වන විට පළමු අදියරේ වැඩ 100% අවසන් කර ඇත. ඒ අනුව වැවක් සහිත සාම්ප්‍රදායික ගම්මානයක දර්ශන රූගත කළ හැකි පසුතලයක් ලෙස නිර්මාණකරුවන්ට එම ප්‍රදේශය නිර්මාණ සඳහා යොදා ගත හැකිය.

නවනගර ප්‍රදේශයේ සනීපාරක්ෂක වැසිකිලි පද්ධතියක් නොතිබීම නිසා සේවා ලබා ගැනීමට පැමිණෙන ශිල්පීන්ට මෙන්ම උද්‍යානයට පැමිණෙන නරඹන්නන් මුහුණ දෙන අපහසුතා වලට පිළියමක් ලෙස නගර ප්‍රදේශය තුළ නව වැසිකිලි පද්ධතියක් ඉදිකිරීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රු. මි. 7.5 ක් වැය කළ ඇති අතර මෙමඟින් සේවා

ලාභීන්ට සහ උද්‍යාන නරඹන්නන්ට ප්‍රශස්ත මට්ටමේ සනීපාරක්ෂක පහසුකම් ලබා දීම අපේක්ෂිතය. හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරුගේ අධීක්ෂණය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.




- උද්‍යානයේ ගම්මානය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගැමි ගෙවල් පහක් සහ කෝරලේ වලව්ව ප්‍රතිසංස්කරණය කිරීම, නගර ප්‍රදේශයේ පිහිටි කාර්ගිල්ස් ගොඩනැඟිල්ල, නිපොන් හෝටලය, බැංකු ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙමගින් නිර්මාණකරුවන් සඳහා තම අවශ්‍යතා පරිදි වෙනස්කර ගත හැකි දර්ශන පසුතල සැපයෙන අතර නරඹන්නන් ආකර්ෂණය කිරීමද අපේක්ෂිතය.
- දකුණු ආසියාවේ විශාලතම හරිත බිත්තිය (Green Wall) සහිත චිත්‍රාගාරය නවීකරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මේ සඳහා මෙම වර්ෂය තුළ වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව යටතේ මෙම වසර තුළ නිම කිරීමට අපේක්ෂිත වැඩ කොටස අවසන් කර දෙස් විදෙස් ටෙලි සිනමා නිර්මාණ කටයුතු සඳහා පවරා දීමට අපේක්ෂිතය. මෙම චිත්‍රාගාරය හරිත බිත්තියද සමග නවීකරණය කිරීමෙන් පසු ලොව ඕනෑම දර්ශන පසුතලයකට ආදේශ කළ හැකිවන ආකාරයට නවීන තාක්ෂණික ක්‍රම යටතේ රූගත කිරීම් කටයුතු සිදු කිරීමට නිර්මාණකරුවන්ට අවස්ථාව ලැබෙනු ඇත.

- 2021 වර්ෂයේ දී උද්‍යානයේ නවීකරණ කටයුතු සඳහා අයවැයෙන් වෙන් වූ රු.මි. 50 සම්පූර්ණයෙන්ම යොදවා 100% මූල්‍ය හා භෞතික ප්‍රගතියක් වාර්තා කිරීමට හැකිවීම විශේෂත්වයකි.

- 2020 සහ 2021 වසර දෙක පුරා පවතින කොවිඩ් වසංගත තත්වය හමුවේ උද්‍යානය නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස වැඩි කාලයක් භාවිතා කිරීම නිසා නිර්මාණ රූගත කිරීම් කටයුතු වලට බාධා වුව ද උද්‍යානය තුළ ජෛව බුබුලක් ලෙස ක්‍රියාත්මක වෙමින් 'ක්ෂීර සාගරය කැළඹිණි' චිත්‍රපටයේ සියලු රූගත කිරීම් උද්‍යානය කේන්ද්‍ර කර ගනිමින් සිදු කිරීමට හැකිවීම ජයග්‍රහණයකි.

2.6 ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය (නෙළුම් පොකුණ)

රටෙහි පවතින වත්මන් කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රඟහලේ ප්‍රසංග හා උත්සව තරමක් සීමා වුවද එම අභියෝගකාරී තත්වය තුළ පවා 2021 වර්ෂය තුළ දී ප්‍රසංග සහ උත්සව සෞඛාරක්ෂිත ක්‍රමවේද යටතේ පවත්වමින් රුපියල් මිලියන 15.3 ආදායමක් උපයා ගැනීමට ආයතනයට හැකි විය. එහි දී වනිතා අභිමාන 2020-2021, AIMS ආයතනයේ උපාධි ප්‍රධානෝත්සවය, IIHE ආයතනයේ උපාධි ප්‍රධානෝත්සවය සහ විවාහක රූ රැජිණ 2020 යන උත්සව සඳහා අවශ්‍ය පහසුකම් සපයන ලදි.










2.7 කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය

මේ ආයතනය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වර්ෂය තුළ දී විශේෂ අවධානය යොමු කරමින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

- **ආයතනික පුස්තකාලය සංවර්ධනය**

මෙම ව්‍යාපෘතියේ අරමුණ දැනට පවත්නා ආයතනික පුස්තකාලය වඩා විධිමත් හා ප්‍රමාණවත් ග්‍රන්ථ සහ උපකරණ වලින් පෝෂණය කිරීමය. ග්‍රන්ථ පරිශීලනය කිරීමට පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, කලායතන සිසුන් ඇතුළු බාහිර පාර්ශව වෙත අවස්ථා ලබා දීම සිදු කෙරේ.




- **ඌව කෞතුකාගාරය නවීකරණය කිරීම**

ශ්‍රී ලංකාවේ ඉපැරණි ලේඛන කලාව පිළිබඳ අධ්‍යයනය හා සංරක්ෂණය උදෙසා අතීතයේ ලිය වී ඇති පුස්කොළ පොත් සංගණනයක් කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම ඓතිහාසික පුසුල්පිටිය රජ මහා විහාරය කේන්ද්‍ර කර ගනිමින් සිදු කෙරේ. ඒ සඳහා වැය කළ මුදල රු.මි 1.3 කි.




- **කන්ද උඩරට උරුමය ආශ්‍රිතව ලේඛක අත්වැල වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

ව්‍යාපෘතිය යටතේ එක් ග්‍රන්ථයකින් උපරිම පිටපත් 350කට යටත්ව ග්‍රන්ථ 18,500 අධික සංඛ්‍යාවක් මිල දී ගෙන ඇත. මෙම ග්‍රන්ථ තෝරා ගත් පාසල්, විශ්ව විද්‍යාල සහ මහජන පුස්තකාල සඳහා බෙදා හැර ඇත.




- **ශ්‍රී සංඝබෝධි පිරිවෙන, ධම්මසිද්ධාරාමය, පුරිජ්ජල, මාතලේ, පිරිවෙනෙහි ඉපැරණි පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම සඳහා පුස්තකාල පහසුකම් සැපයීම මෙම වර්ෂයේ දී සිදු කරන ලදි.**



සංරක්ෂණයට පෙර භාවිතා කළ පුස්තකාලය



පුස්තකාලය සහ පුස්කොළ පොත් සංරක්ෂණ ඒකකය ලෙස නවීකරණය කරන ගොඩනැගිල්ල

එම ව්‍යාපෘති වලට අමතරව මෙම වර්ෂය අවසන් වීමට පෙර පහත සඳහන් ව්‍යාපෘතිවල වැඩ කටයුතුද අවසන් කිරීමට සැලසුම් කර මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.

- හිඳගල රජ මහා විහාරස්ථානයේ බිතු සිතුවම් නඩත්තුව සහ සංරක්ෂණ ව්‍යාපෘතිය.
- ඇහැළේපොළ පුරාණ විහාරස්ථානයේ පිහිටි මාතලේ විරුවන් අනුස්මරණ ශාලාවෙහි ඉතිරි වැඩ නිම කිරීම (අදියර අදියර I හා අදියර II)
- බල ප්‍රදේශයේ තෝරා ගත් දහම් පාසල් පුස්තකාල සඳහා ග්‍රන්ථ බෙදා දීම.
- ඓතිහාසික වීරත්වය හා වර්තමානය කාන්තා දින සැමරුම් ව්‍යාපෘතිය
- " සිතුවම් හා ප්‍රතිමා නිර්මාණ ශාස්ත්‍ර විධි" ග්‍රන්ථය මුද්‍රණය කිරීම
- පුරාණ සාම්ප්‍රදායික ශාන්ති කර්ම, ජන ඇදහිලි, සංග්‍රහ විධි සහ චාරිත්‍ර චාරිත්‍ර සංරක්ෂණය කිරීම.

2.8 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

මෙම ආයතනය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වර්ෂය තුළදි විශේෂ අවධානය යොමු කරමින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

- **ගවේෂණ හා ලේඛනගත කිරීම් යටතේ** හිරිවඩුන්න පුරාවිද්‍යා භූමිය ගවේෂණය, නාගොල්ල පුරාවිද්‍යා භූමිය ගවේෂණය සහ පුරාවිද්‍යා ස්ථානවල මායිම් කණු යෙදීම සිදු කරන ලදී.





- **කැණීම් ව්‍යාපෘතිය යටතේ** කුරුන්දිපබ්බත විහාරය කැණීම, කාඩිගල පැරණි ස්තූප මළුව කැණීම සහ යාපහුව පර්යේෂණ කැණීම මේ වන විටත් ක්‍රියාත්මක කරමින් පවතී.





❖ **අභිලේඛන හා නාණකවිද්‍යා**

මඩකලපුව පුලූටුමානෝඩ ශිලාලේඛන පිටපත් කිරීම, වාස්තුවිද්‍යා සංරක්ෂණ, දීඝවාපි මළුව සංරක්ෂණය, උළුගල සංඝාවාසය සංරක්ෂණය සහ පයාගල වෙහෙරගල කන්ද පුරාණ විහාරය සංරක්ෂණයට අදාළ කටයුතු සිදු කරන ලදී.

❖ **රසායන සංරක්ෂණ**

ගලපාත පුරාණ විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය, සුදර්ශන පරමානන්ද විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය සහ මැටි කොටමුල්ල විහාරයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී.





❖ **කෞතුකාගාර**

මාතර තාරකා කොටුව පවත්වා ගෙන යාම, පනාවිටිය තොරතුරු මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම සහ වයිනේ කෞතුකාගාර පවත්වා ගෙන යාම (කෝට්ටේ/ අනුරාධපුර/ යටාල/ ත්‍රිකුණාමලය)

❖ **ප්‍රවර්ධන**

ජාතික පුරාවිද්‍යා සමුළුව පැවැත්වීම සහ ප්‍රකාශන මුද්‍රණය.





❖ **රිටිගල බන්දා පොකුණ සංරක්ෂණය**





\

2.8 අපේ ගම

මෙම ආයතනය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වර්ෂය තුළ දී විශේෂ අවධානය යොමු කරමින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත.

01. **අපේ ගම ජන උරුම මධ්‍යස්ථානය ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත්කිරීම** සඳහා වූ පනත් කෙටුම්පත් පත සකස් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර එය ඉදිරියේ දී නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කිරීමටත් අනතුරුව පාර්ලිමේන්තුවට යොමු කර ආයතනය විධිමත් නෛතික ඒකකයක් ලෙස ස්ථාපිත කිරීමටත් කටයුතු කරනු ඇත.

02. ව්‍යාපාර සංවර්ධන සැලැස්ම සකස් කිරීම.
අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දන්වා ඇති පරිදි ස්වයංමූල්‍යකරණ ආයතනයක් ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ව්‍යාපාර සංවර්ධන සැලස්ම මේ වන විට සකසා අවසන් කර ඇති අතර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

03. **අලෙවි සහ ප්‍රවර්ධන සැලැස්ම පිළියෙල කිරීම**.
අපේ ගම වෙළඳ නාමයක් ලෙස ලියාපදිංචි කිරීම. වෙබ් අඩවියක් නිර්මාණය කිරීම. යුටියුබ් නාලිකාවක් ආරම්භ කිරීම හා සමාජ මාධ්‍ය ජාල භාවිතය ෆේස් බුක් ටුවිටර් ලින්ක්ඩින් ඉන්ස්ටර්ග්‍රෑම් යෙදුම් සැකසීම සිදු වෙමින් පවතී.

ඉදිරි දැක්ම

ජාතික උරුම සංරක්ෂණය, ප්‍රාසාංගික කලාවන් සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධනය යන ඉතා පුළුල් ක්ෂේත්‍ර තුනකට අයත් විෂයයන් මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනේ. දැනට පවතින අණපත් වලට හා නීති රාමුවලට අනුකූලව ඉහත ප්‍රධාන ක්ෂේත්‍ර වලට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීම මගින් එම විෂය සඳහාම වූ අභිනව අමාත්‍යාංශයක් පිහිටුවීමේ අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීමටත් එය මෙරට සමාජ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක කිරීමටත් හැකි වන පරිදි අමාත්‍යාංශය විසින් විධිමත් වැඩ පිළිවෙලක් සකසා ඇත.

ජාතික උරුමයන් සංරක්ෂණය, සාහිත්‍ය හා කලාවන් ප්‍රවර්ධනය කිරීම තුළින් අභිමානවත් ශ්‍රී ලංකාවක් යන දැක්ම යටතේ සුවිශේෂී අරමුණු එකොළහක් සහ සුවිශේෂී ප්‍රමුඛතා හතක් යටතේ අමාත්‍යාංශයේ ඉදිරි ක්‍රියාමාර්ග සැලසුම් කර ඇත. එම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඇතැම් ව්‍යාපෘති සෘජුවම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර සෙසු ව්‍යාපෘති සහ වැඩසටහන් අමාත්‍යාංශ විෂය පථය යටතට පවරා ඇති ආයතන හා දෙපාර්තමේන්තු විසින් ක්‍රියාත්මක කෙරේ.

ජාතික උරුම හඳුනා ගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නොතිබීම එම ක්ෂෙත්‍රයේ පවතින ප්‍රමුඛ ගැටළුවක් ලෙස හඳුනා ගන්නා ලද අතර, ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකස් කිරීමට විද්වත් කමිටුවක් පත් කිරීම 2021 වර්ෂයේ දී සිදු විය. එම විද්වත් කමිටුව විසින් සකස් කළ වාර්තාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, එමගින් ලැබී ඇති නිර්ණ ක්‍රියාත්මක කිරීම සඳහා වූ වැඩ පිළිවෙළක් සැකසීම ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත ය.

එසේම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය වන සෞභාග්‍යයේ දැක්මේ සඳහන් සියලු ජන කණ්ඩායම් සහ ආගම්වලට අයත් පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික වටිනාකමක් ඇති සිද්ධස්ථාන සහ ජාතික උරුමයන් පිළිබඳ තොරතුරු ඇතුළත් ‘‘ඩිජිටල් පුරාවිද්‍යා විශ්වකෝෂයක්’’ නිර්මාණය කිරීමේ අරමුණ ලඟාකර ගැනීම උදෙසා සියලු ජාතික උරුම ඇතුළත් ඩිජිටල් දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත. ඉදිරියේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය සමඟ එක්ව මෙම කර්තව්‍ය ඉටු කිරීම අරමුණු කර ඇත.

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින සියලුම අංශවල කලාකරුවන්ගේ විස්තර ඇතුළත් කලාකරු දත්ත පද්ධතියක් සකස් කිරීම මේ වන විට අවසන් කර ඇත. මෙම දත්ත පද්ධතියට දිවයින පුරා සිටින කලාකරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතී. සංචාරක අමාත්‍යාංශය හා ඒකාබද්ධව සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රසංග හා අනෙකුත් කලා කටයුතු සඳහා කලාකරුවන් සම්බන්ධ කර ගනිමින් මෙය පුළුල් වැඩසටහනක් බවට පත් කිරීම ඉදිරියේ දී සිදු කෙරේ. එමගින් කලාකරුවන්ගේ උන්නතිය ළඟාකර ගැනීම සඳහා දායක වීම සිදුකිරීමට යෝජිත ය. මේ තුළින් කලාකරුවාගේ වෘත්තීය සුරක්ෂිතභාවය තහවුරු කිරීම අපේක්ෂා කරනු ලැබේ.

ශ්‍රී ලංකාව තුළ ජීවත් වන ආදිවාසී හා වෙනත් සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන් ඉදිරියට පවත්වාගෙන යාම හා ඔවුන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළ එම ප්‍රජාවන්ගේ ප්‍රජා අයිතීන් සුරැකීම හා ඔවුන්ගේ එදිනෙදා ජීවන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සහාය ලබා දීම ද අමාත්‍යාංශය විසින් ඉදිරි වැඩසටහනට ඇතුළත් කර ඇත. එමෙන්ම දඹාන ජන උරුම කේන්ද්‍රය චිරස්ථායී ලෙස පවත්වාගෙන යාම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීම සිදු කෙරෙණු ඇත.

දේශීයත්වය මුල්කරගත් කතෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු අමාත්‍යාංශයට ගැසට් පත්‍රය මඟින් පවරා ඇති සුවිශේෂී කාර්යභාරයකි. කතෘභාග ගෙවීමේ ක්‍රමවේදය දැනට සංගීත ක්ෂේත්‍රය සඳහා පමණක් යම් මට්ටමකට හෝ ක්‍රියාත්මක වේ. නමුත් ඒ සඳහා විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම මූලික කටයුතු ආරම්භ කර ඇත.. එමගින් නිර්මාණයන්හි සැබෑ හිමිකරුවන්ට ඔවුන්ට හිමි කතෘභාග හිමි කර ගැනීමේ අයිතිය තහවුරු කිරීම අපේක්ෂා කෙරේ. මෙම කරුණු ද සැලකිල්ලට ගනිමින් කතෘභාග ගෙවීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් අදාල ආයතන සමඟ සාකච්ඡා ආරම්භ කර කොට ඇත. කතෘභාග හිමිකම් ඇති විවිධ ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරීත්වය එකිනෙකට වෙනස්වීම හේතුවෙන් සියලුම අංශ සඳහා පොදු යානත්‍රණයක් සකස් කිරීම අභියෝගයකි. ඒ අනුව විවිධ අංශවල ඇති සුවිශේෂිතා අවධානයට ලක් කරමින් මෙම යාන්ත්‍රණය සකස් කිරීම සිදු වනු ඇත.

මෙරට කලා ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන බොහෝ කලාකරුවන්ට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති අතර බොහෝ කලාකරුවන්ගේ ජීවිකාව පවත්වාගනු ලබන්නේ ඉතා අසීරු ලෙස ය. දිර්ඝ කාලීනව කලා ක්ෂේත්‍රයේ නියැලීමේ දී අනාගත සුරක්ෂිත බව සැලකිල්ලට නොගෙන වූව ද කලාව උදෙසා සුවිශේෂ කාර්යයක් ඉටු කරන අවස්ථා ඉමහත් ය. එවන් අවස්ථාවක කලාකරුවන් හා ශිල්පීන්ගේ සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යොජනා ක්‍රමයක් හඳුන්වාදීම මේ වන විට සිදු කර ඇති අතර එය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගත යුතුව ඇත.

ශ්‍රී ලාංකීය ප්‍රෞඩත්වය හා අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා අපගේ ජාතික උරුමයන් සංරක්ෂණය කර අනාගත පරපුරට උරුම කර දීම සඳහා ඔවුන්ගේ ජන්මභූමි කේන්ද්‍ර කර ගනිමින් ඔවුන්ගේ නිර්මාණ, ඔවුන් පරිහරණය කළ උපකරණ, ඔවුන්ගේ ඡායාරූප, ජීවන අවස්ථා පිළිඹිබු වන ආකාරයේ ග්‍රාමීය කලා ගම්මාන නිර්මාණය කිරීම තුළින් වත්මන් සමාජයට දේශීය කලාකරුවන් පිළිබඳ අවබෝධයක් ලබා දීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

දේශීය පෞඩත්වය විදහා දක්වන පැරණි සංස්කෘතික අංග වත්මන් සමාජයෙන් ගිලිහී යාම වැළැක්වීම සඳහා මෙන්ම අතීත උරුමය ඉදිරි පරපුර වෙත දායාද කිරීමේ අරමුණ පෙරදැරිව අපගේ පැරණි සංස්කෘතික අංග ප්‍රවර්ධනය හා සංරක්ෂණය උදෙසා ක්‍රියාත්මක වීමද අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් කොට සලකයි. එමෙන්ම, මෙතෙක් වැඩි අවධානයක් යොමු නොවූ ග්‍රාමීය කලා ක්ෂේත්‍රයන් කෙරෙහි සුවිශේෂි අවධානයක් යොමු කිරීමට ද අපේක්ෂිත ය.

සමස්ථයක් ලෙස ජාතික උරුමයන් සංරක්ෂණය, ප්‍රාසාංගික කලාවන් ප්‍රවර්ධනය සහ ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධනය සඳහා සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සිදු කිරීමත්, එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පසුබිම සැකසීමත් අමාත්‍යාංශය මගින් සිදු කෙරේ.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය :	දිනය : 2022. 02. 23	දිනය : 2022/02/23

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
අලුතුම
ඉදිධශාසන, ආගමික හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය
ලක්ෂ 135, "දහම්පාය",
සංස්කෘතික ධර්මපාල මාවත

කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ
අලුතුම
ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා
ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
4 වන මහල, "යෙත්සිරිපාය" - 11 අදියර
බත්තරමුල්ල

ආර්.ටී.කේ. වැලිවීමගේ
ප්‍රධාන ගණකාධිකාරී
ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා
ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

පරිච්ඡේදය 03
3.1 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	2021 රු.	තත්‍ය නැවත ඉලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		409,157,000	102,640,000	ඒසිඒ-3
-	තැන්පතු		22,325,561	27,614,376	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		2,717,970	622,142	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		48,410,693	3,893,593	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**482,611,224**	134,770,111	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**482,611,224**	134,770,111	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		191,305	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		482,419,919	134,770,111.00	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
93,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	62,950,089	20,093,642	
112,486,500	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	90,761,462	36,055,770	ඒසිඒ-2(ii)
126,313,500	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	120,060,701	121,927,198	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	7,000	-	
332,600,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**273,779,252**	178,076,611	
	මූලධන වියදම්				
56,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	28,960,209	21,946,322	
20,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	14,698,494	8,988,291	
134,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	98,587,345	316,634,973	ඒසිඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
9,300,000	හැකියා වර්ධනය	14	3,731,522	295,464	
52,000,000	වෙනත් මූලධන වියදම්	15	35,366,131	4,248,498	
271,300,000	**මුළු මූලධන වියදම් (උ)**		**181,343,701**	352,113,548	
	තැන්පතු ගෙවීම්		143,212,376	69,679,881	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		4,995,117	5,897,506	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		148,207,493	75,577,387	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		603,330,446	605,767,545	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(120,910,527)	(470,997,434)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		120,910,527	468,510,129	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			120,910,527	-	

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	25,235,066	10,536,571
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	7,552,511	5,275,364
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**32,787,576**	**15,811,935**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(124,761,310)	(247,925,272)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		25,235,066	10,536,571
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	132,313,821	253,200,636
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**32,787,576**	**15,811,935**

පිටු අංක 07 සිට 67 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 68 සිට 84 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය :	දිනය : 2022. 02. 23	දිනය : 2022/02/23

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්
ඉද්ධශාසන, ආගමික හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය
අංක 135, "දහම්පාය",
අනගාරික ධර්මපාල මාවත

කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ
ලේකම්
ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා
ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
4 වන මහල, "සෙත්සිරිපාය" - 11 අදියර
බත්තරමුල්ල

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා
ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය
අමාත්‍යාංශය

2021 දෙසැම්බර් 31 දිනට

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	457,336,331	106,533,594
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	
අග්‍රිම ලැබීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**457,336,331**	**106,533,594**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	215,760,017	65,402,556
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	191,305	-
අත්තිකාරම් ගෙවීම්	3,339,904	-
තැන්පතු ගෙවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**219,291,226**	**65,402,556**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**238,045,105**	**41,131,038**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	231,362	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	1,597,094	219,803
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**1,828,456**	**219,803**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	133,227,206	14,075,956
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**133,227,206**	**14,075,956**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(131,398,750)**	**(13,856,153)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**106,646,355**	**27,274,885**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
තැන්පතු ලැබීම්	22,325,561	3,789,692
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**22,325,561**	**3,789,692**
අඩුකළා : මුදල් වැය කිරීම්		
තැන්පතු ගෙවීම්	128,971,916	31,064,577
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**128,971,916**	**31,064,577**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(106,646,355)**	**(27,274,885)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් එකතු කිරීමේ ආයතනයක් නොවේ.

රු.,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය(රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	332,700,000.00	332,700,000.00	216,660,537	65%
ප්‍රාග්ධන	271,300,000.00	271300,000.00	133,227,206	49%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන වෙනත් ආයතන වලට වෙන් කරන ලද ප්‍රතිපාදන නොමැත.

රු.,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		

3.9 මූල්‍ය නොවන වත්කම් කිරීමේ කාර්ය සාධනය

රු.,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	25,235,066	25,235,066	-	100%
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

පරිච්ඡේදය 04

විගණන වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date

ගරුතර,

ග්‍රාමීය උල්පත්, ප්‍රජාසේන කලා සහ ක්‍රීඩා කලා මිල්ලිති පුවරුවන හවුලකු රාජ්‍ය අමාත්‍යාංශය

මාතෘකා 401 - ග්‍රාමීය උල්පත්, ප්‍රජාසේන කලා සහ ක්‍රීඩා කලා මිල්ලිති පුවරුවන හවුලකු රාජ්‍ය අමාත්‍යාංශය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ග්‍රාමීය විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

ග්‍රාමීය උල්පත්, ප්‍රජාසේන කලා සහ ක්‍රීඩා කලා මිල්ලිති පුවරුවන හවුලකු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පුකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන පුකාශය හා මූල්‍ය පුවාහ පුකාශයටත් සම්බන්ධ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය පුකාශන 2018 අංක 19 දරන ග්‍රාමීය විගණන පනතේ විධිවිධාන යටතේ සංයෝජිතව කියවිය යුතු ලී ලංකා ප්‍රමාණාත්මක සම්මතයේ සාරාංශයේ සඳහන්වූ වැදගත් විධිවිධාන පුකාශ කිරීමෙන පසුව විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ග්‍රාමීය විගණන පනතේ 11(2) වගන්තිය පුකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර එමගින්වෙත් නිරීක්ෂණ කිරීමෙන් පසුව ග්‍රාමීය විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කවුළු කර එමගි වාර්තාව දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන පුතිසාධන ක්‍රියාමාර්ග පනත් සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. එමෙම වාර්තාව සහෝදර දී ඇති යම් ක්‍රියාමාර්ගයක් පනත් කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ පනත් කොන්දේසියේ පත්තු නිගමනයක් ම ගැබ් මා වෙත දැන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය පුකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 නිගුණිකාරණ අවධානය

(අ) තෝරාගත් නොවන ලැබීම

විගණන නිරීක්ෂණය	නිර්වේදය	නිර්ණායක නිල්පාරිශ්‍රේ අදහස් දැක්වීම
වර්තමාන නිරීක්ෂණයේ අවධානය වීමින් එම් කරන ලද රු. 48,410,693 ක තෝරාගත් මූල්‍ය කාර්ය කරන්නේ පුකාශයේ නොවන ලැබීම් වර්තමාන වර්තමාන පුධාන අරමුදල් වෙතින් නිකුත් ලැබීම් වලය ඇතුලත් කර නිර්වාහන් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය කරන්නේ පුකාශයේ තෝරාගත් නොවන ලැබීම් රු. 48,410,693ක් වැඩිවෙන් හා අදින් වන්නෙ රු. 48,410,693ක් වලයෙන් දැක්වුණි.	එම තෝරාගත් මූල්‍ය පුකාශ පුකාශයට හා අත්තිකාරම් තෝරාගත් නිකුත් කිරීම් වලය.	එකඟතාවක් නිල්පාරිශ්‍රේ අදහස් දැක්වීම් වර්තමාන වර්ෂය වෙනි. පුතිවැදගි නිල්පාරි නිරීක්ෂිත හවුලකු කරනි.

+94 11 2 88 70 28 - 36 | +94 11 2 88 72 23 | agi@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
වර්ෂය අවසානයට අමාත්‍යාංශය සතුව වාහන 19ක් පැවති අතර 2021/12/31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ (ඒසිඒ-පී ආකෘතිය) සහ දේපළ පිරියත හා උපකරණ පිලිබඳ විස්තරාත්මක සටහනෙහි (සිඒසි-6) එම වාහනවල වටිනාකම් ඇතුලත්ව නොතිබුණි.	වාහන වල වටිනාකම් නක්සේරු කර ගිණුම්ගත කල යුතුය.	2020.08.09 දින මෙම අමාත්‍යාංශය ස්ථාපිත කරන අවස්ථාවේ සිට අමාත්‍යාංශය සඳහා ස්ථිරවම කිසිදු රථවාහනයක් අයත්ව නොතිබුණි දැනට අයත්ව ඇති වාහන අදාල ආයතනවලින් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i) ඇප තැන්පතු ලේඛනය		
මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ නොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් නොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය.	නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට අදාල කටයුතු කරමින් පවතී.
(ii) බැරකම් පිළිබඳ ලේඛනය		
මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි 241 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක සටහන් කළ යුතුය.	බැරකම් ලේඛනය පවත්වාගෙන යනු ලබයි. 2020/21 බැරකම් 2020/22 ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.

(iii) නිවාඩු පිළිබඳ ලේඛනය

ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 ප්‍රකාරව නිවාඩු පිලිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.	190 පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව අනුමත කරන ලද නිවාඩු සටහන් කිරීම සඳහා නිවාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.	නිවාඩු ලේඛනය මේ වන විට යාවත්කාලීන කර ඇත.

(iv) චෙක්පොත් ලේඛනය

මුදල් රෙගුලාසි 384(3) ප්‍රකාරව චෙක්පොත් ලේඛනය පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි 384(3) ප්‍රකාරව චෙක්පොත් ලේඛනය පවත්වා ගත යුතුය.	චෙක්පොත් ලේඛනය මේ වන විට පවත්වා ගෙන යනු ලබයි.

(v) වැය ලෙජර

මුදල් රෙගුලාසි 447 (3) ප්‍රකාරව වැය ලෙජර යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි 447(3) ප්‍රකාරව වැය ලෙජර යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.	වැය ලෙජරය මේ වන විට යාවත්කාලීන කර ඇත.

(ඇ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	දැනට අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයන් සමාලෝචනයක් සිදු කර නොමැති අතර ඉදිරියේදී පද්ධතිය ඵලදායි ලෙස සකස් කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමෙන් අනතුරුව එහි පිටපතක් විගණනයට ඉදිරිපත් කරනු ලබන බවට දන්වා සිටිමි.

	යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.		
(ii)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම් සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.11 ඡේදය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත යවා තිබූ විගණන විමසුම් 07 කට පිළිතුරු ලබා දී නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	විගණන විමසුම් 3ක් සඳහා පිලිතුරු මේ වන විට විගණකාධිපති වෙත යවා ඇත. විගණන විමසුම් 2ක් සඳහා පිලිතුරු සකස් කර අනුමැතියට ඉදිරිපත් කර ඇත. විගණන විමසුම් 1ක් සඳහා පිලිතුරු සකස් කල වහාම විගණනයට ඉදිරිපත් කරමි.
(iii)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මෙම අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත වී නොමැති බැවින් එම තනතුර අනුමත කර දෙන ලෙස ඉල්ලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා මේ වන තෙක් අනුමැතිය ලැබී නැත. තනතුර අනුමත වූ වහාම අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය. දැනට බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් එම කාර්ය සිදු කරනු ලබයි.

(ඉ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය		නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම		
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) අනුව්‍යවස්ථාව	ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානය විසින් උපයන සියලුම ආදායම් ඒකාබද්ධ අරමුදලට නොගෙවා ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අයත් අංක 009-0-020-0-0-6000 දරන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	උපයන සියලුම ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය.	ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානයේ ආරම්භයේ සිට වරින් වර ජනාධිපති ලේකම් කාර්යාලය, සංස්කෘතික අමාත්‍යාංශය යන ආයතන යටතට පවරා තිබුණි. දැනට එම ආයතනය වෙනුවෙන් වැය විෂයයක් ඇති කර එහි ව්‍යදම් දැරීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව අයවැය දෙපාර්තුමේන්තුව විසින් දුරකථන මඟින් දැනුම් දී ඇත.
(ii)	2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතෙහි 18(1)(අ) හා 20(1) වගන්ති	1. අයනීකාර විකිරණ සම්බන්ධිත ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම සහාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ මිස නොකල යුතු වුවත්, නෙළුම් පොකුණ රඟහල සඳහා ගමන්මළු පරීක්ෂණ යන්ත්‍රය මිලදී ගැනීමේදී එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර සභාවට දැන්වීමට කටයුතු කර නොතිබුණි.	පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	මෙම රහහල විසින් මිළදී ගනු ලැබූ ඉහත යන්ත්‍රයෙහි මාන (Dimension) සහිත සටහනක් වේ. එසේ හෙයින් පරමාණුක බළශක්ති ආයතනයේ අනුකූලතාවයන් සපුරන බව නිරීක්ෂණය වේ.

		2. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අංක AERC/CS/11/G4/3 සහ 2021 අප්‍රේල් 09 දිනැති ලිපිය මඟින් රහහල වෙත දන්වා ඇති පරිදි යන්ත්‍රය තුලට ගමන්මලු බහාලන්නන් X කිරණ සමඟ සෘජු සම්බන්ධතා ඇතිවීම වලක්වනු පිණිස යන්ත්‍රයෙහි මළු ගෙනයන පටියක අවම දිග (Conveyor belts) මීටර 1 ක් විය යුතු වුවද රහහල විසින් මිලදිගත් යන්ත්‍රය එම අවශ්‍යතාවය සපුරා නොතිබුණි.	විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	ගමන්මළු යන්ත්‍රය තුලට ගෙනයන පටියෙහි දිග (conveyor belts) මීටර 1 ක දිගක් ඇති බව නිරීක්ෂණය වේ . තවද මෙම යන්ත්‍රය EN61010-2091:2012, EN61000-6-4/A:2011, EN61000-62:2005, EN61326-1:2006 සහ ISO12100:2010 යන ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් පවතී.
(iii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය			
	XII වැනි පරිච්ඡේදයේ 3වන හා 13වන වගන්ති	අවසර දී ඇති අවස්ථාවන්ට පරිභාහිර අවස්ථාවන් සඳහා සහ කාලය නොසලකා අමාත්‍යාංශ සේවකයන්ට රාජකාරී නිවාඩු ලබාදී නිබුණි.	ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.	2020 වර්ෂයේ අවසන් කාර්තුවේදී මෙම අමාත්‍යාංශය ස්ථාපිත කළ පසු ප්‍රමාණවත් භෞතික සම්පත් ලබාදී නොතිබුණි. පැවති කොවිඩ් වසංගත තත්වය මත පොදු ප්‍රවාහන සේවාවන්ද විධිමත්ව ක්‍රියාත්මක නොවිණි. ඒ අනුව නිලධාරීන් බැහැර යැවීම සඳහා අවශ්‍යතාව අනුව පෞද්ගලික ප්‍රවාහන පහසුකම් භාවිතා කිරීමෙන් අදාළ කාර්යය ඉටු කිරීම සඳහා රාජකාරී නිවාඩු ලබා දී ඇත.

(iv) ශ්‍රී ලංකා ප්‍රජානාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

1. මුදල් රෙගුලාසි 3(1)	රජයේ සියළුම කාර්යයන් කලින් තීරණය කර සැලසුම් හා වැඩසටහන් වල දැක්විය යුතු වුවද, නෙළුම් පොකුණ රඟහලට අදාල වියදම් සැලසුම් වාර්ෂික ඇස්තමේන්තුවේ ඇතුලත් කර පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.
2. මුදල් රෙගුලාසි 156 හා 210(2)	නෙළුම් පොකුණ රඟහලෙහි මාසික විදුලි බිල්පත් සඳහා දින 15 ක් ඇතුලත ගෙවීම් කිරීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.281,596 ක ප්‍රමාද පොලී මුදලක් ගෙවීමට සිදුව තිබුණි. ගෙවීම් ප්‍රමාද වීම මත විසන්ධි කරන ලද විදුලි සැපයුම් නැවත ලබා ගැනීම් සඳහා රු.6,000ක්ද අමාත්‍යාංශය ගෙවා තිබුණි. ගෙවීම් ප්‍රමාද කිරීම නිලධාරියෙකුගේ නොසැලකිල්ල හෝ අතපසු වීමක් හේතුවෙන් සිදුව ඇත්නම් එම ප්‍රමාදය වෙනුවෙන් අයවිය යුතු ගාස්තු	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	2021 වර්ශය තුලදි කෝවිඩ් වසංගතය හේතුවෙන් ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානයේ අදායම් නොලැබුන හෙයින් විදුලි බිල්පත් ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් මුදල් ලබා ගැනීමට සිදු විය. එම මුදල් ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම බිල්පත් ගෙවීම ප්‍රමාද වී ඇත.

	අදාල නිලධාරීන්ගෙන් අයකර ගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.		
3. මුදල් රෙගුලාසි 162(2)	නෙළුම් පොකුණ රහහලේ ගාස්තු වෙනුවෙන් ලද චෙක්පත් උපලබ්ධි වී ඇති බව නහවුරු කරගැනීමෙන් නොරව රහහල කුලියට දී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	එහි සේවය කරනු ලබන ත්‍රිවිධ හමුදාවේ අයවළුන්ට ඇති අනවබෝධය නිසා මෙවැනි දෑ සිදු වී ඇති බව පිළිගනිමි. ඉදිරියේ දී මෙවැන්නක් සිදු නොවීමට උපදෙස් ලබා දී ඇත
4.මුදල් රෙගුලාසි 201(2)	2021.10.15 දින සිට වැටුප් රහිත විදේශ අධ්‍යන නිවාඩු ලබාගෙන තිබූ නිලධාරිණියකට 2021 ඔක්තෝබර් හා නොවැම්බර් මාසයන්ට අදාලව රු.94,747ක් වැටුප් ගෙවා නිබුණි	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	වැඩිපුර ගෙවූ වැටුප නැවත අමාත්‍යාංශය වෙත මුදලින් ගෙවන ලෙස දන්වා නිලධාරිනියට 2022.01.31 දින ලිපියක් යවා ඇත.
5. මුදල් රෙගුලාසි 261(1)	එකතුව රු.612,061 ක් වූ ගෙවීම් වවුචර් 02 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	සියලු වවුචර විගණනයට ඉදිරිපත් කරනු ඇත.
6. මුදල් රෙගුලාසි 392(ඇ) සහ 394(ආ)	චෙක්පත් අවලංගු කිරීම හා හිලවු චෙක්පත් නිකුත් කිරීම නිසිපරිදි සටහන්කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	මේ වන විට නිසි පරිදි සටහන් කිරීමට පියවර ගෙන ඇත.
7. මුදල් රෙගුලාසි 565(5)	නැන්පතු ගිණුම් 20 අදාලව පොදු 71 යෙහි ආකෘති පත්‍ර පිළියෙල කෙරෙන මාසික නැන්පතු සාරාංශ විගණකාධිපති ලබාදී වෙත නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	දැනට සකස් කර ඇත.

8. මුදල් රෙගුලාසි 756	2020.12.31 දිනට නෙළුම් පොකුණ රඟහලේ නඩත්තු කටයුතු සඳහා ආනයනය කරන ලද භාණ්ඩ පැවති ගබඩාවෙහි සමීක්ෂණයක් සිදු කිරීමට 03 දෙනෙකුගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නිබුණද ගබඩාවෙහි පවතින භාණ්ඩ සම්බන්ධ සමීක්ෂණය කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නිබුණද උග්‍ර කෝවිඩ් තත්වය හේතුවෙන් නිලධාරීන්ට සේවය සඳහා පැමිණිමට හැකි වුයේ අත්‍යවශ්‍ය රාජකාරී සඳහා පමණි. එම නිසා 2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වුවද 2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණය අවසන් කර වාර්තාව විගණනයට ඉදිරිපත් කර ඇත.
9. මුදල් රෙගුලාසි 835(1)	නෙළුම් පොකුණ රඟහලේ නඩත්තු කටයුතු සිදුකරන වින සමාගමේ තාක්ෂණික කණ්ඩායමට රඟහලට අයත් භාණ්ඩ ගබඩාකර තැබීම සඳහා නෙළුම් පොකුණ රඟහල වෙත ලබාගෙන තිබූ ගබඩා සංකීර්ණය, 2020 අගෝස්තු 09 සිට 2022 පෙබරවාරි දක්වා ලබා ගැනීමේදී අමාත්‍යාංශ ලේකම් වෙතින් අධිකාරි බලය ලබාගෙන නොතිබූ අතර නාගරික සංවර්ධන අධිකාරිය සමඟ කුලී ගිවිසුමකට එළඹ්ද නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	කුළී ගිවිසුමේ අඩංගු වගන්ති කිපයක් සංශෝධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට යවා ඇත. එයට පිලිතුරු ලැබූ වහාම ගිවිසුමට එලඹීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
(v) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය	නෙළුම් පොකුණ රඟහල සඳහා අයකරන ගාස්තු 2012 වර්ෂයේ සිට සංශෝධනය කිරීමට අවශ්‍ය පියවරගෙන නොතිබුණි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	ගාස්තු සංශෝධනය කර කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කැබිනට් පත්‍රිකාව සුදානම් කර ඇත.

(vi)	2015 ජුනි 17 දිනැති අංක 3/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 2.3 උපවගන්තිය	කන්ද උඩරට උරුමය පිළිබඳ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සභාපති, උපසභාපති යන නිලධාරීන්ගේ වෙනත් සේවා නියුක්ත වීම් පිළිබඳව තොරතුරු ලබාගෙන නොතිබුණි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	කන්ද උඩරට උරුමය සුරැකීමේ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සභාපති හා උප සභාපති යන අයට ඇගිලි සලකුණු තැබීමට මේ වන විට උපදෙස් ලබා දී ඇත.
(vii)	2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරණ වන්කම් කළමණාකරන චක්‍රලේඛයෙහි 2(i) හා 2(ii) උපවගන්ති	අමාත්‍යාංශය භාවිතා කරන වාහන 16ක අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	වාහන 3 ක් මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කර ගන්නා අවස්ථාවේ දී ධාවනයෙන් ඉවත් කර තිබුණද රථවාහනවල දැඩි අවශ්‍යතාව මත අලුත්වැඩියා කරමින් ධාවනයේ යොදවා ඇත. වාහන 2ක් මෙම අමාත්‍යාංශයේ භාවිතය සඳහා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙතින් තාවකාලිකව ලබා දී ඇති බැවින් පවරා ගත නොහැක. මෙම අමාත්‍යාංශය යටතේ ඇති නෙලුම් පොකුණ රහහල විසින් භාවිත කරන වාහන 6ක් අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට විරුද්ධත්වයක් නොමැති බවට මෝටර් රථවාහන කොමසාරිස් වෙත එකහතා ලිපියක් නිකුත් කරන ලෙස ඉල්ලා ඇතත් මේ දක්වාම එම එකහතාව ලබා දී නොමැත. වාහන 3 ක් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.
(viii)	2021 පෙබරවාරි 19 දිනැති අංක 02/2021 දරණ වන්කම් කළමණාකරන චක්‍රලේඛය	සියළුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විසින් තම ආයතන යටතට ගැනෙන වාහන පිලිබඳව 2020 දෙසැම්බර් 31 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු 2021 මාර්තු 15 දිනට පෙර කොමිස්ට්‍රොලර් ජනරාල්	චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	2020.08.09 දින මෙම අමාත්‍යාංශය අභිනවයෙන් ස්ථාපිත කරන අවස්ථාවේ සිට පවරා ගැනීමේ කටයුතු අවසන් නොවීම හේතුවෙන් අමාත්‍යාංශය සඳහා ස්ථිරවම කිසිදු රථවාහනයක් අයත්ව නොතිබුණු බැවින් එම චක්‍රලේඛය අනුව

		කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතු වුවත් අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි.		කටයුතු කිරීමට නොහැකි වුණි.
(ix)	2016 පෙබරවාරි 11 දිනැති අංක 1/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (2)වන ඡේදය	අවස්ථාවන් දෙකකට වැඩිවන පරිදි ලබා ගන්නා ආවරණය නොකරන ප්‍රමාදවීම් අවස්ථාවන් වෙනුවෙන්ම නිලධාරියාගේ නිවාඩු වලින් දින භාගය බැගින් අඩු නොකල අවස්ථා විය.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 02/2021 චක්‍රලේඛ හා සංශෝධන පරිදි නිලධාරීන්ගේ නිවාඩු පිළිබඳ නැවත සමාලෝචනය කර නිවාඩු වාර්තාව යාවත්කාලීන කර ඇත.
(x)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I), 2021 මාර්තු 05 දිනැති අංක 2/2021 හා 2017 පෙබරවාරි 17 දිනැති අංක 03/2017 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	අමාත්‍යාංශ නිලධාරීන් ඇතැම් අවස්ථාවලදීද, අපේ ගම කාර්යාලීය නිලධාරීන් හා ආරක්ෂක නිලධාරීන්ද, කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සභාපති හා උප සභාපතිද පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇතිලි සලකුණු යන්ත්‍ර භාවිතාකර නොතිබුණි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	අමාත්‍යාංශය නිලධාරීන් සඳහා මේ වන විට ඇතිලි සලකුණු යන්ත්‍රය හා පැමිණීමේ හා පිටවීමේ පොතක් ද ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සභාපති හා උප සභාපති වෙත ඇතිලි සලකුණු නැබීමට මේ වන විට උපදෙස් ලබා දී ඇත. අපේ ගම පරිශ්‍රයේ ඉතා සුළු සංඛ්‍යාවක් සහිත කාර්ය මණ්ඩලයකට (05 දෙනෙකුට) පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇතිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයක් සවිකිරීම ආර්ථිකම වශයෙන් ඵලදායි නොවන බැවින් හා 2021 වර්ෂයට මූල්‍ය ප්‍රතිපාදන වෙන් වී නොතිබු බැවින් ඇතිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය මිල දී ගැනීමට නොහැකි විය.

(xi) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

1. මාර්ගෝපදේශ 2.7.7	2021 දෙසැම්බර් 21 දින ප්‍රසම්පාදන තීරණ අනුව නෙළුම් පොකුණ රහහල සඳහා ගමන්මළු පරීක්ෂණ යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාලව රහහල ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවක් ලෙස සලකා සාමාජිකයන් 06 දෙනෙකු පත් කර නිබු අතර රහහල අයත් රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මෙම කමිටුව සඳහා ලබාගෙන නොතිබුණි.	ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයගේ අනුමැතිය ලබාගත යුතුය.	ප්‍රසම්පාදන කමිටුව සඳහා අනුමැතිය ලැබී ඇත.
2. මාර්ගෝපදේශ 3.4.1(අ)(1)	මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ ප්‍රසම්පාදනය සඳහා සීමිත මිල ගණන් කැඳවීමක් (ආයතන 19 කින්) 2021 මාර්තු 22 දින සිදුකර නිබුණද කිසිදු මිල ගණනක් ඉදිරිපත්ව නොතිබූ බැවින් අනතුරුව නැවත සීමිත මිල ගණන් කැඳවීමක් (ආයතන 12 කින්) 2021 ඔක්තෝබර් 11 දින සිදුකර නිබූ අතර ඒ සඳහා වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යොදාගෙන නිබුණි. වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යොදා ගත හැක්කේ වටිනාකමින් අඩු, වහාම ලබාගත හැකි භාණ්ඩ	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	2021 මාර්තු 22 දිනැතිව ආයතන 19කින් සීමිත මිළ ගණන් ක්‍රමය යටතේ මිළ ගණන් කැඳවා ඇති නමුත් ඒ වන විට රට පුරා පැවති කොවිඩ් තත්ත්වය යටතේ බොහෝ ආයතනවල ක්‍රියාකාරිත්වය අඩපණව නිබු බැවින් කිසිදු ආයතනයක් මිළ ගණනක් ඉදිරිපත් කර නොතිබුණි. නමුත් දෙවෙනි අවස්ථාවේ මිළ ගණන් කැඳවන විට ඉතා විශාල ආයතන සංඛ්‍යාවකින් මිළ ගණන් කැඳවීම අත්‍යවශ්‍ය නොවන බව නිරීක්ෂණය කළ අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1හි මිලි.2ක වටිනාකමකින් යුතු භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා සීමිත මිළ

	සම්බන්ධයෙන් බැලීන් උක්ත ප්‍රසම්පාදනය සඳහා ජාතික නරඹකාරී ලංසු කැඳවීම කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.		ගණන් ක්‍රමය යටතේ ආයතන 5කට නොවැඩි සංඛ්‍යාවකින් මිල ගණන් කැඳවීම ප්‍රමාණවත් බව දැක්වෙන හෙයින් ආයතන 12කින් මිල ගණන් කැඳවීම ප්‍රමාණවත් හා සාධාරණ බව තීරණය කර ඇත. (එම කාල සීමාවේදී අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම සඳහා මිල ගණන් කැඳවන ලද ආයතන වලින්ම මේ සඳහාද මිල ගණන් කැඳවන ලදී.)
3. මාර්ගෝපදේශ 5.3.14	"අපේ ගම" ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය සඳහා කළමනාකරණ සහ මූල්‍ය ක්‍රමවේද ඇතුලත් ව්‍යාපාර සහ සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට ලංසු කැඳවීමේදී ව්‍යාපාර සහ සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලෙස පමණක් සඳහන් කරමින් ලංසු කැඳවා තිබූ අතර නම අවශ්‍යතාවය ලංසුකරුවන්ට දැන්වීමටත්, ලංසුකරුවන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් ලබාගැනීමටත් අවස්ථාව සලසමින් ලංසු කැඳවීමට පූර්වයෙන් වූ රැස්වීමක් අමාත්‍යාංශය විසින් පවත්වා නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	අපේ ගම ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය සඳහා ව්‍යාපාර සහ සංවර්ධන සැලැස්මක් සකස් කිරීම මහා පරිමාණ ව්‍යාපාර නොවන ක්ෂුද්‍ර මට්ටමේ ක්‍රියාකාරකමක් වූ බැවින් පූර්ව ලංසු කැඳවීමක් සඳහා වූ රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව පූර්ව ලංසු රැස්වීමක් නොපවත්වන ලදී.
4. මාර්ගෝපදේශ 7.12.1	දඹාන ආදිවාසී ජන උරුම කෞතුකාගාරයේ ආදිවාසී අස්ථි ප්‍රදර්ශන මැදිරිය සඳහා	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ	Interactive Kiosk යන්ත්‍රය සවි කිරීම වෙනුවෙන් වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ආයතන තුනකින් මිල

	Interactive Kiosk යන්ත්‍රයක් සවිකිරීමට අදාල ප්‍රසම්පාදනයේදී ආයතන 03 ක් වෙතින් ලංසු කැඳවන ලද නමුත්, එක් ආයතනයක් පමණක් ප්‍රතිචාර දක්වා තිබූ බැවින් ලංසු ප්‍රතික්ෂේප කර නැවත මිල ගණන් කැඳවිය යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර උක්ත ආයතනය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.	විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	ගණන් කැඳවා තිබුණද ඉන් එක් ආයතනයකින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙම යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ඇත්තේ ආයතන කිහිපයක් පමණි. මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂයේ ඉටුකල යුතුව තිබූ බැවින් හා මෙම කාල වකවානුව රටෙහි Covid වසංගතය හේතුවෙන් ආයතන සාමාන්‍ය පරිදි පවත්වා ගෙන යාමට නොහැකි වීම වැනි හේතු මත අදාල ආයතනයේ මිල පිළිගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කරන ලදී. එසේම, එම ආයතනයේ මිල ගණන් ඇස්තමේන්තුවට වඩා අඩුවීමත් ඉදිරිපත් කර තිබූ පිරිවිතරයන්ට අනුකූල වීමත් මත පදනම්ව නැවත මිල ගණන් කැඳවීමකින් තොරව එම මිල පිළිගැනීමට තීරණය විය.
5. මාර්ගෝපදේශ 8.9.3	රුපියල් මිලියන 25 දක්වා ක්‍රොන්ත්‍රාත්තු සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් බලය පවරා දී ඇති ප්‍රසම්පාදන අස්ථිත්වයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් විසින් අත්සන් කල යුතු වුවත් නෙළුම් පොකුණ රහහල සඳහා ගමන්මළු පරීක්ෂණ යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාල රු.4,800,000 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුම රහහලේ ප්‍රධාන විධායක නිලධාරී විසින් අත්සන් කර තිබුණි.	රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් බලය පවරා දී ඇති ප්‍රසම්පාදන අස්ථිත්වයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් විසින් අත්සන් කල යුතු යුතුය.	ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානයේ ආයතන ප්‍රධානියා වන්නේ ප්‍රධාන විධායක නිලධාරී වේ. ඔහුට කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමට රේඛීය අමාත්‍යාංශය විසින් බලය ලබා දී ඇත.

6. මාර්ගෝපදේශ 8.12.4. හා 5.4.6	(a)	මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී කාර්ය නිමකිරීමට පෙර හා කාර්ය නිමකර ඇති බවට වූ සහතිකයක් නොමැතිව 2021 දෙසැම්බර් 15 දින සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල ගෙවා නිබුණි. එසේ වුවද විගණිත දිනය වන විටත් මහජනතාවට ප්‍රවේශ විය හැකි ආකාරයට වෙබ් අඩවිය ක්‍රියාකාරී තත්වයේ නොපැවතුණි.	කාර්ය නිමකිරීමට පෙර හා කාර්ය නිමකර ඇති බවට වූ සහතිකයක් නොමැතිව ගෙවීම් නොකල යුතුය.	2021 වර්ෂයේ ගිණුම් පියවීමේ වකුලේඛ අනුව 2021.12.15 ට පෙර ITMIS පරිගණක පද්ධතියට සියලුම බැඳීම් ඇතුළත් කරන ලෙස උපදෙස් ලැබී ඇති බැවින් 2021.12.14 දිනැතිව ඉදිරිපත් කළ Invoice පරිගණක පද්ධතියට ඇතුළත් කර 2021.12.31 දින චෙක්පත් අංක 533274 යටතේ අදාළ ගෙවීම් සිදුකොට ඇත.
	(b)	ගෙවීම් කිරීමේදී රඳවා ගැනීම් මුදලක් රඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ගෙවීම් කිරීමේදී රඳවා ගැනීම් මුදලක් රඳවා ගත යුතුය.	පිලිතුරු ලබාදී නැත.
	(c)	කොන්ත්‍රාත්තුවේ නඩත්තු කාලය කාර්ය නිමකර වසර 1ක් වන බැවින් එම මුළු කාලය ආවරණය වන පරිදි කාර්යසාධන බැඳුම්කරය ලබාගත යුතු වුවත් කාර්ය ආරම්භ කල දින සිට මාස 6ක් දක්වා පමණක් කාර්යසාධන බැඳුම්කරය ලබා ගෙන තිබුනි.	නඩත්තු කාලය ඇතුළත් වන පරිදි කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	කොන්ත්‍රාත්තුව පිළිගැනීමේ දී අනපසු වීමකින් නඩත්තු කාලය පිළිබඳ කොන්ත්‍රාත්තුවේ ඇතුලත් කර නොතිබුණි. ආයතනය විසින් 2022 ජුනි 15 දින දක්වා වූ කාර්යසාධන බැඳුම්කරය 2021.12.15 දින ඉදිරිපත් කර ඇති අතර එම කාලය අවුරුද්දක් දක්වා දිර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ.

(xii)	2017 අගෝස්තු 18 දිනැති අංක:අමප/17/1 557/711/017 දරණ අමාත්‍ය මණ්ඩල තීරණ	2021 දෙසැම්බර් 31 දින වන විටත් පනත සම්මත කර කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය විධිමත් පරිදි පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.	කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා වූ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය විධිමත් පරිදි පිහිටුවීමට අවශ්‍ය පියවර ගත යුතුය.	කන්ද උඩරට අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සඳහා සකස් කල ලියවිල්ල නීතිපතිවරයා යොමු කල අතර එය නීතිපතිවරයා විසින් නිරීක්ෂණ සහිතව 2022.04.06 දින එවා ඇත. ඉදිරි කටයුතු මේ දිනවල සිදු කරමින් පවතී.
(xiii)	2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරණ ජනාධිපති ලේකම්ගේ ලිපිය	1. අමාත්‍යාංශය විසින් රාජ්‍ය අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ නිලධාරීට මෝටර් වාහනයක් වෙන් කර නිබුණි.	ජනාධිපති ලේකම්ගේ ලිපියෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	චක්‍රලේඛයේ 2.1 හි සඳහන් අමාත්‍ය කාර්ය මණ්ඩලයේ අංක 01 සිට 04 දක්වා නනතුරුවලට අදාළව නිලධාරීන් 05 දෙනෙක් ඇතුළත් වේ. එම චක්‍රලේඛයේ 3.4 අනුව එම නිලධාරීන් එක් වාහනයක් සඳහා හිමිකම් ලබයි. ඒ අනුව, නිල වාහන අනුයුක්ත කර ඇත.
		2. අමාත්‍යවරුන්ගේ කාර්යාලවල සේවයේ නියුක්ත කරවනු ලබන සහාය කාර්ය මණ්ඩලය 15 දෙනෙකු නොඉක්මවිය යුතු වුවද රාජ්‍ය අමාත්‍යවරයාගේ සහාය කාර්ය මණ්ඩලය ලෙස අනුමත රියදුරන් සංඛ්‍යාව ඉක්මවා 05 ක් සේවයේ යොදවා නිබුණි.	ජනාධිපති ලේකම්ගේ ලිපියෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා අමාත්‍යාංශය විසින් අනුයුක්ත කර ඇති නිල වාහන ධාවනය කිරීම සඳහා යෙදවීමට රජයේ රියදුරන් අනුයුක්තව නොසිටී බැවින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව ගරු අමාත්‍යතුමා ධුරය දරන කාලසීමාවට පමණක් බලපැවැත්වෙන පරිදි කොන්ත්‍රාත් පදනමින් තාවකාලිකව රියදුරන් 05 දෙනෙක් බඳවා ගෙන සේවයේ යොදවා ඇත.

(xiv)	රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2020 නොවැම්බර් 18 දිනැති අංක 01/2020/NH/2/ 4/2020 දරන අභ්‍යන්තර මූල්‍ය චක්‍රලේඛය	නෙළුම් පොකුණ රඟහලේ නිලධාරීන් විසින් අවස්ථා 5 කදී චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි.	අභ්‍යන්තර මූල්‍ය චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය.	ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානයේ අත්‍යවශ්‍ය වියදම් දැරිය යුතු අතර වියදම් සීමා කිරීමේ චක්‍රලේඛය අනුව වියදම් සීමා කළ නොහැකිය.

(ඊ) අවධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
	---	---	---
(i)	නෙළුම් පොකුණ රහඟල කුලී පදනම මත ලබා දීමේදී භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව ඇතැම් පාර්ශවයන් වෙතින් සහනදායී මිල ගණන් අයකර තිබුණි.	සහනදායී මිල ගණන් අයකිරීමට භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය.	අධ්‍යාපනික ආයතනවලට සහනදායී පදනම් මත රහඟල ලබා දෙන අතර අනෙකුත් ආයතන වෙත සහනදායී පදනම් මත ලබා නොදේ.
(ii)	නෙළුම් පොකුණ රහඟල පරිශ්‍රය තුල වර්ග අඩි 400 ක පමණ භූමියක් ආපනශාලාවක් පවත්වාගෙන යාම සඳහා යුධ හමුදාව වෙත ලබාදී තිබූ අතර ඒ සඳහා යුධ හමුදාව වෙතින් කිසිදු කුලී මුදලක් අයකරගෙන නොතිබුණි. එසේ වුවද පරිශ්‍රයට අදාලව පිරිසිදු කිරීම්, විදුලි බිල්, ජල බිල් යනාදිය රහඟල මගින් දරා තිබුණි.	ආපනශාලාව පිහිටි පරිශ්‍රය තක්සේරුකර කුලී මුදලක් අයකරගත යුතුය.	ආපන ශාලාව ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානයේ සුභසාධනය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන බැවින් කුළී ගෙවීම් කර නොමැත. කෙසේ වෙතත් ඉදිරියේ දී රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් උපදෙස් ලබා ගෙන කුලී මුදලක් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
(iii)	චීන තාක්ෂණික සහයෝගිතා ගිවිසුම අනුව, නෙළුම් පොකුණ රඟහල සඳහා අවශ්‍ය ආයුධ, උපකරණ, යන්ත්‍ර හා උපාංග යනාදිය බදු නිදහස්ව ආනයනය කර ගැනීමට ඉඩසහසුකම් සලසා තිබූ අතර ඒ අනුව චීන සමාගම විසින් 2021 ජනවාරි සිට පූලි දක්වා කාලය තුල	අදාල භාණ්ඩ විධිමත් පරිදි බාර ගැනීමට පියවර ගත යුතුය.	මේ වන විට 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය මේ වන විට අවසන් කර ඇති අතර චීන සමාගම විසින් ආනයනය කල ප්‍රාග්ධන භාණ්ඩ විධිමත්ව සොයා බලා රහඟල වෙත භාර දීමට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි සමාජිකයන් 3 ගෙන් යුතු මණ්ඩලයක් පත් කිරීමට

	රහහල වෙනුවෙන් ආනයනය කල භාණ්ඩ වෙනුවෙන් අමාත්‍යාංශය විසින් අවස්ථා 09 කදී රු.14,366,103 ක් රේගු බදු ගෙවා තිබුණි. ඒ අනුව නඩත්තු කටයුතු සඳහා ආනයනය කරන ලද භාණ්ඩ වල හිමිකම ශ්‍රී ලංකාවට පැවරී තිබු අතර ගබඩාවෙහි ගබඩා කර තිබු එම ආනයනය කරන ලද ප්‍රාග්ධන භාණ්ඩ වර්ග 19 ක අයිතම 74 ක් රහහල වෙත භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.		කටයුතු කර ඇත.
(iv)	නෙළුම් පොකුණ රහහලේ අලුත්වැඩියා නඩත්තු කටයුතු සිදුකරන චීන සමාගම ආනයනය කරන ලද රහහලට අයත් භාණ්ඩ ගබඩාකර තැබීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් වර්ග අඩි 14262 ක් වන පැලියගොඩ ගබඩා සංකීර්ණය මාසික කුලී පදනම මත 2010 මාර්තු 01 දින සිට නෙළුම් පොකුණ රහහල වෙත ලබාගෙන තිබුණි. ගබඩාව සඳහා 2020 අගෝස්තු 01 සිට 2021 ජුලි 31 දක්වා රු.724,125 බැගින් මාසික කුලියක් අයකර තිබු අතර 2020 ඔක්තෝබර් සිට 2021 ජුලි දක්වා බිල්පත් ප්‍රමාද වී එවා නිබියදී සියයට 24ක ප්‍රමාද කුලී වශයෙන් රු.1,348,018ක් අමාත්‍යාංශය වෙතින් අයකර නිබුණි. ගබඩාව 2021 සැප්තැම්බර් මස ආපසු භාරදීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2022 පෙබරවාරි දක්වා මාස 5ක ගබඩා කුලී ලෙස රු.3,910,275ක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි.	ගබඩා සංකීර්ණය ලබා ගැනීම සඳහා ගෙවා තිබු ප්‍රමාද කුලිය ආපසු අයකර ගැනීමට කටයුතු කල යුතුය. මාස 5ක ගබඩා කුලී ලෙස අනාවරණය කරගැනීමට කටයුතු කළ යුතුය.	හිඟ පොළි ඉවත් කර ගැනීම උදෙසා රාජ්‍ය අමාත්‍යාංශය විසින් නාගරික සංවර්ධන අධිකාරියට ලිපියක් යවා ඇති අතර එයට පිලිතුරු ලැබු වහාම කුලී ගෙවීමට කටයුතු සුදානම් කර ඇත.එසේම මේ වන විට මෙම ගබඩාව නාගරික සංවර්ධන අධිකාරියට භාර දී ඇත.
(v)	කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩල කාර්යාල	අමාත්‍යාංශය විසින් දේපළෙහි	ගොඩනැගිල්ලේ සවිකිරීම් වෙනුවෙන් බදු කරුගෙන් අයවිය යුතු මෙම

	පරිශ්‍රය සඳහා මහනුවර මහ නගර සභා සීමාව තුල පිහිටි ගොඩනැගිල්ලක් බදු කුලී පදනමට ගැනීමට අදාල බදු ගිවිසුමට අනුව අමාත්‍යාංශය විසින් දේපලෙහි සිදු කරන ලද රු.6,194,607ක සවිකිරීම් හා ඉදිකිරීම් බදු ගිවිසුම අවසානයේ, පවත්නා තක්සේරු වටිනාකම බදුදීමනාකරු වෙතින් අය කර ගැනීමට අමාත්‍යාංශය පියවර ගෙන නොතිබුණි.	සිදු කරන ලද සවිකිරීම් හා ඉදිකිරීම් වල පිරිවැය බදුදීමනාකරු වෙතින් අය කර ගැනීමට පියවර ගත යුතුය.	රු.6,194,607 ක මුදල අයකර ගත යුතු වන්නේ එම ගොඩනැගිල්ල බදු කරුට භාර දුන් විටය. නමුත් එම ගොඩනැගිල්ලේ දැනට අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය පවත්වා ගෙන යන බැවින් ගොඩනැගිල්ලෙන් ඉවත් වීමේදී එම මුදල අවසාන මාස වල බදු මුදලෙන් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.
(vi)	දඹාන ආදිවාසි ජන උරුම කෞතුකාගාරය තුල ආදිවාසි අස්ථි ප්‍රදර්ශන මැදිරියේ interactive kiosk යන්ත්‍රය 2021 දෙසැම්බර් 30 දින ස්ථාපිත කර නිබුණද අදාල ඉන්ටොයිස් පත්‍රය 2021 දෙසැම්බර් 06 දින වන විට අමාත්‍යාංශය වෙත එවා නිබූ අතර ගෙවිය යුතු මුළු මුදල වූ රු.994,520 , 2021 දෙසැම්බර් 27 දින ගෙවා නිබුණි. ඒ අනුව කාර්ය නිම කිරීමට පෙර ගෙවීම් නිර්දේශ කිරීම හා අනුමත කර තිබීම විගණනයේදී මතභේදයට තුඩුදුනි.	කාර්ය නිම කිරීමට පෙර ගෙවීම් නිර්දේශ කල හා අනුමත කල නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය.	දඹාන ආදිවාසි ගම්මානයේ කොවිඩ් රෝගීන් බහුලව සිටීම හේතුවෙන් යන්ත්‍රය ආදිවාසි ගම්මානයට ප්‍රවාහනය කර මැදිරිය තුළ සවි කිරීමට ප්‍රායෝගික ගැටළුවක් පැන නැගුණ බැවින් එම කාර්යය සිදුකර ඇත්තේ 2021/12/30 දිනය. යන්ත්‍රය සම්පූර්ණ වශයෙන් නිම කර මෘදුකාංගය ද ඇතුලත් කර අමාත්‍යාංශයට වාර්තා කිරීමෙන් පසු වාර්ෂික ගිණුම් පියවීමේ අවශ්‍යතාවය මත 2021/12/27 දින අදාල චෙක්පත ලියා නිබුණ ද එය සැපයුම්කරු වෙත බාර දෙන ලද්දේ යන්ත්‍රය ආදිවාසි කෞතුකාගාරයේ සවි කිරීමෙන් අනතුරුව පසු 2022/01/10 වන දිනය.
(vii)	අපේ ගම පරිශ්‍රය වෙන් කිරීම් සඳහා අයකරනු ලබන ගාස්තු සඳහා 2021 ඔක්තෝබර් 05 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව නිබුණි. එසේ වුවද 2021 නොවැම්බර්, දෙසැම්බර් මාස වල එම ගාස්තු සියයට 75 සිට සියයට 25 දක්වා අඩුකර සහනදායී මුදලකට වෙන්කිරීම් වෙන් කිරීම් සිදු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරියගේ අනුමැතිය ලබා දී නිබුණද, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබාගෙන නොතිබුණි. සංශෝධිත ගාස්තු අනුව මුදල් අයකිරීම	ගාස්තු අඩු කිරීමට භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු අතර අමාත්‍යාංශයට සිදුවූ පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය.	කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නිරෝධායන ඇදිරි නීති කාලසීමාව අවසන් වීමෙන් පසුව පනවන ලද විවිධ සීමා හේතුවෙන් අපේ ගම පරිශ්‍රය වෙන්කිරීම් සඳහා ඉල්ලීම් නොලැබුණි. තවද මහජනතාවට ඇති වූ ආර්ථික අපහසුතා හේතුවෙන් සහනදායී මුදලකට වෙන්කිරීම් ලබාදෙන ලෙස ඉල්ලීම් ලැබිණි. එබැවින් වෙන්කිරීම් නොකර කිසිදු ආදායමක් රැස් නොකර සිටීමට වඩා රජයට යම්කිසි ආදායමක් රැස්කිරීම පිළිබඳව සලකා 2021.12.31

	හේතුවෙන් අමාත්‍යාංශයට රු. 1,217,275 ක පාඩුවක් සිදුව තිබුණි.		දින දක්වා මාස 02ක කාලයකට සහනදායී මිල ගණන් අනුමත කරන ලදී.
(viii)	2021 දෙසැම්බර් මස වැටුප සමග සේවකයෙකුට හිඟ වැටුප් ගණනය කර ගෙවීමෙදී, අවස්ථා තුනකදි ගෙවා තිබූ රු.16,176ක හිඟ වැටුප් ගෙවීම් සැලකිල්ලට ගෙන නොතිබීම හේතුවෙන් රු.16,176ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	හිඟ වැටුප් ලෙස වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	වැඩිපුර ගෙවන ලද රු.16,175.84ක මුදල නැවත ගෙවා නිම් කරන ලෙස 2022.05.19වන දින අදාළ නිලධාරී මහතා වෙත ලිඛිතව දන්වා ඇත.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	ළමුන්ගේ කලා රසඥතාව වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතිය (වැය විෂය: 401-2-3-21-1409) යටතේ හේවිසි භාණ්ඩ කට්ටල 102 ක් බෙදා දීම සඳහා වැය කරන ලද රු.2,759,500ක වියදම් දැයේ උරුමය දරුවන්ටයි දැනුවත් කිරීමේ වැඩසටහන (401-2-3-11-2401 වැය විෂය) යටතේ ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව අදාල ව්‍යාපෘතියේ වියදම් රු.3,112,307ක් ලෙස හා ප්‍රතිපාදන ඉතිරිය රු.1,887,693ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර තිබුණද, වැය විෂයයට අදාළ මුළු වියදම් රු.5,621,700ක් හා ප්‍රතිපාදන සීමාව ඉක්මවා දැරූ වියදම් රු.621,700ක් විය.	වියදම් නිවැරදි වැය විෂයන් යටතේ ගිණුම්ගත කල යුතුය.	හේවිසි භාණ්ඩ මිල දී ගැනීම වැරදීමකින් 401-2-3-11-240 1 යටතේ ගිණුම් ගත කර ඇති අතර එය වැරදි වැය ශීර්ෂ යටතේ ගිණුම් ගත වී ඇති බව පිළිගනිමි. මෙම වැය විෂය යටතේ වියදම් වූ මුළු මුදලින් 2022.01.24 දින මාරු පත්‍රයක් මඟින් රු. 846,807/- ක මුදලක් 2021 වර්ෂයේ දෙවන ගිණුම් සාරාංශය මඟින් 401-2-03-21- 1409 වැය විෂයට මාරු කර ඇති අතර ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා නැති බව කාරුණිකව දන්වමි.
(ආ)	ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් නාක්ෂණය හඳුන්වා දීම (වැය විෂය: 401-2-3-15-2509) ව්‍යාපෘතිය සඳහා රු.10,000,000ක ප්‍රතිපාදන වෙන්කර තිබූ	වියදම් නිවැරදි වැය විෂයන් යටතේ ගිණුම්ගත කල යුතුය.	2021 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව විඩියෝ 30ක් නිර්මාණය කිරීම සඳහා ජාතික උරුම පර්යේෂණ හා සංරක්ෂණ ඒකකයක්

අතර මූල්‍ය ප්‍රකාශන අනුව රු.5,265,828ක් වැය කර රු.4,734,172ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එසේ වුවද මෙම ව්‍යාපෘතියට අදාළව රු.8,500,000ක් 401-2-3-16-2509 (ජාතික උරුමයන් සඳහා පර්යේෂණ හා සංරක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම) යන වැය විෂයය යටතේ වැය කර තිබුණි. ඒ අනුව වැය විෂය: 401-2-3-15-2509 යටතේ මුළු වියදම රු.13,765,828ක් හා ප්‍රතිපාදන ඉක්මවා දැරූ වියදම රු.3,765,828ක් විය.

ස්ථාපනය කිරීම යන ව්‍යාපෘතියේ (401-2-03-016-2509) අයවැය ප්‍රතිපාදන වලින් රු. මිලියන 8.5 ක් වෙන් කර ඇත.

ඒ අනුව වීඩියෝ 30ක් නිර්මාණය කිරීමට වැය වූ සම්පූර්ණ මුදල 8,936,500 ක් වූ අතර හිඟ මුදල 436,500 ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් නාක්ෂණය හඳුන්වා දීම ව්‍යාපෘතියෙන් ලබා ගෙන ඇත (401-2-03-015-2509).

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	වැය විෂයයන් 9 කට අදාල රු.3,983,308 ක ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා පුනරාවර්තන වැය විෂයයන් 8 කට හා මූලධන වැය විෂයයන් 1 කට අදාල පිළිවෙලින් රු.4,957,518ක හා රු.87,107ක බැරකම් වලට එළඹ තිබුණි.	ගෙවිය යුතු සියළු අගයන් බැඳීම් හා බැරකම් ප්‍රකාශයට ඇතුලත් කල යුතුය.	401-1-2-0-1201, 401-2-3-9-1509 යන වැය විෂයන් අදාළ නොවන අතර 401-3-9-1509 මෙවැනි වැය විෂයක් අමාත්‍යාංශය සඳහා නොමැත. 401-1-1-0-1301- පැරණි වාහන රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී ඇති බැවින් අඩන්වැඩියාවන් අධික විය. 401-1-2-0-1402- දෙසැම්බර් මසට අදාළ දුරකථන බිල්පත් 2022 ගෙවා ඇත. 401-2-3-8-1508- අපේ ගම සඳහා වැය විෂයක් වෙන් නොකළ බැවින් ජන කලා කේන්ද්‍රයේ වැය විෂය යටතේ වියදම්-- දැරීමට සිදුවිය. 401-2-3-1-1409- කන්ද උඩරට සුරකිම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සඳහා වැය විෂයක් නොතිබුණ බැවින් මු.රෙ.66 මාරු කිරීම මගින් වියදම් දරන ලදි. 401-2-3-10-1509 - මහින්ද රාජපක්ෂ වෙලි සිනමා උද්‍යානයේ ගෙවීම් මේ

යටතේ සිදු කරන ලදි.

(ආ)	සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව වැය විෂයයන් 11කට අදාලව රු.4,419,964 ක ශේෂයක් දක්වා තිබුණද, නියැදි වවුචර් පරීක්ෂාවේදී 2022 ජනවාරි හා පෙබරවාරි මාසවල අවස්ථා 27කදී 2021 වර්ෂයට අදාලව රු.12,374,686ක් ගෙවීමකර තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල මුළු බැඳීම් හා බැරකම් රු. 12,374,686ක් අඩුවෙන් දක්වා තිබුණි.	වර්ෂ අවසාන සියළු බැඳීම් හා බැරකම් ගිණුම් ගත කල යුතුය.	ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානයේ වියදම් පොදු නැන්පත් ගිණුම මගින් සිදු කරනු ලබන බැවින් එයට අදාළ වියදම් බැරකම් ලේඛනයට ඇතුළත් කර නොමැත. එම වියදම් ඉදිරියේ දී බැරකම් ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. අමාත්‍යාංශය, ආයතනවල පසුගිය වර්ෂයට අදාළ බිල්පත් 2022 වර්ෂයේ බැරකම් ලේඛනයට ඇතුළත් කර ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2021 වර්ෂය සඳහා නෙළුම් පොකුණ රහහල වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ වර්ෂය තුල එක් එක් වැය විෂයය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත කාර්යයන් ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් ඇතැම් වැය විෂයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කිරීමට අපේක්ෂා කරන ලද කාර්යයන් නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි විය. අමාත්‍යාංශය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර තිබූ අතර එය ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව අමාත්‍යාංශය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතුය.	2021 වර්ෂය සඳහා ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සාදා නැති බව පිළිගනිමි. නමුත් 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානය විසින් පිළියෙල කර ඇත. අමාත්‍යාංශයේ වැය විෂයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඇති නමුත් ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානයේ ගණුදෙණු පොදු නැමපත් ගිණුමෙන් දරණ බැවින් අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට එය ඇතුලත් වී නොමැත.
(ආ)	(i) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා	අමාත්‍ය මණ්ඩල	පිලිතුරු ලබාදී නැත.

	අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සම්බන්ධයෙන් වූ 2017 අගෝස්තු 15 දිනැති අංක MSEW/CM/13/2017 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව කන්ද උඩරට උරුමය සුරැකීමට අදාලව ව්‍යාපෘති 4 ක් හඳුන්වා දී නිබුණද එම ව්‍යාපෘති 04 මත පදනම්ව එහි ක්‍රියාකාරකම් සැලසුම් කර නොනිබුණි. සුවිශේෂී කාර්යයන් 02 ක් වශයෙන්, ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා පවතින ආයතනවල ඵලදායිත්වය ඉහල නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මුද්‍රිත කෘති, නාට්‍ය, සිනමා, චිත්‍ර හා මූර්ති, සංගීත හා නර්තන කර්මාන්තයන් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම යන කාර්යයන් යටතේ වූ ක්‍රියාකාරකම් 2021 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නිබුණද එක් එක් ක්‍රියාකාරකම් සඳහා භෞතික ඉලක්ක ඇතුලත් කරද නොනිබුණි.	අනුමැතිය අනුව අදාල ව්‍යාපෘති 4 සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කර යුතුය.	
(ii)	මණ්ඩලයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් වූ රු.9,022,841ක ප්‍රතිපාදන වෙන් කල ව්‍යාපෘති 5 ක් වර්ෂය තුල ක්‍රියත්මක කර නොනිබුණි.	වර්ෂය තුල ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කාර්යයන් නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට මෙම ව්‍යාපෘති ඇතුලත් කලද රටේ පැවැති උග්‍ර කොවිඩ් තත්වය හේතුවෙන් සෞඛ්‍ය මර්ගෝපදේශ අනුව මාස 02ට අධික කාලයක් රට වසා තැබීම හේතුවෙන් හෙයින් මෙම ව්‍යාපෘති කිරීම නවතා දමන ලදි.
(ඇ)	ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්තුමය කාර්යසාධන වාර්තා පිළියෙල කිරීමට කටයුතු කර නොනිබුණි.	කාර්තුමය කාර්යසාධන වාර්තා පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	මුල් කාර්තු තුන සඳහා වෙන් වෙන් වශයෙන් කාර්තුමය කාර්යසාධන වාර්තා සකස් කිරීම වෙනුවට එම කාර්තු තුනේම කාර්යසාධනය ඇතුළත් කරමින් අය-වැය විවාදය අවස්ථාවේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා 2020/21 ප්‍රගතිය හා 2022 ක්‍රියාකාරී සැලැස්ම නම් වාර්තාව සකස්

කරන ලදී.

(ඇ) ක්‍රියාකාරී සැලැසුම් තුල ඇතුලත් වූ එක හා සමාන කාර්යයන් වෙනුවෙන් අමාත්‍යාංශ/ආයතන දෙකක් සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදී තිබුණි.

(i) අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන ටවර්හෝල් රහහල පදනම් විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රේක්ෂා කලාකරු වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා මහාභාණ්ඩාගාරයෙන් රු. මිලියන 15ක මුදලක් 2021 වර්ෂය තුළ ලබාදී ඇත. එසේ නිබියදී අමාත්‍යාංශය විසින්ද කලාකරුවන්ට හදිසි අනතුරු හා වෛද්‍යාධාර රක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට රු. මිලියන 10ක ප්‍රතිපාදන ලබාගෙන නිබුණි.	අමාත්‍යාංශ/ආයතන සිය අරමුණු හා කාර්යයන් පැහැදිලිව නිර්වචනය කරගෙන ඒ මත කටයුතු අතර ප්‍රතිපාදන ලබාගැනීමේදී ද්විත්ත්වකරණයවීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගත යුතුය.	ටවර්හෝල් රහහල පදනම විසින් ක්‍රියාත්මක කරන ප්‍රේක්ෂා කලාකරු වෛද්‍යාධාර රක්ෂණය ටවර්හෝල් රහහල පදනමෙහි ලියාපදිංචි නාට්‍ය ක්ෂේත්‍රයේ කලාකරුවන්ට පමණක් ලබා දේ. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද කලාකරුවන් සඳහා වන හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණය ප්‍රාසංගික ක්ෂේත්‍රය, ලේඛන කලාව හා නාට්‍ය ක්ෂේත්‍රය ද ආවරණය වන පරිදි ලබා දෙන ලදී. රක්ෂණාවරණ දෙකෙහි අරමුණු හා ප්‍රතිලාභීන් ද වෙනස් වන අතර ද්විත්ත්වකරණයක් සිදු නොවේ.
(ii) බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට (ශීර්ෂය 101) ශිල්ප ගම්මාන වැඩසටහන සඳහා රු. මිලියන 2ක් ලබාදී නිබියදී ජාතික උරුම ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින්ද ග්‍රාමීය කලා ගම්මාන නිර්මාණය සඳහා රු. මිලියන 10ක ප්‍රතිපාදන ලබාගෙන නිබුණි.	අමාත්‍යාංශ සිය අරමුණු හා කාර්යයන් පැහැදිලිව නිර්වචනය කරගෙන ඒ මත කටයුතු අතර ප්‍රතිපාදන ලබාගැනීමේදී ද්විත්ත්වකරණය වීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගත යුතුය.	රාජ්‍ය අමාත්‍යාංශය යටතේ කලා ගම්මාන නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ ශ්‍රී ලාංකීය අභිමානය විදහා දැක්වීම සඳහා සිය නිර්මාණ දායකත්වය ලබාදුන් දක්ෂ අප්‍රසිද්ධ කලාකරුවන් නෝරාගෙන ඔවුන්ගේ සංස්කෘතික වස්තූන් සමාජගත කිරීම සඳහා කුඩා කෞතුකාගාරයක් නිර්මාණය කිරීම වේ. බුද්ධශාසන ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන ශිල්ප ගම්මාන වැඩසටහන වෙනත් අරමුණකින් ක්‍රියාත්මක කරනු ලබන අතර එය අපගේ පාලනයෙන් තොර ආයතනයකි. ව්‍යාපෘති අතර ද්විත්වකරණයක් සිදු නොවේ.

3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) වර්ෂය තුල ක්‍රියත්මක කල යුතු වූ රු.2,000,000ක මුදලක් ඇස්තමේන්තු කර තිබූ කලාකරුවන්ට ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීමේ කාර්යය ඉටුකර නොතිබුණි.	සැලසුම් කල කාර්යයන් නියමිත පරිදි ඉටු කල යුතුය.	අපේක්ෂිත කාල සීමාව තුළදී, කලාකරුවන්ගේ දත්ත ඇතුළත් අයදුම්පත් අමාත්‍යාංශය වෙත නොලැබිණි. කලාකරුවන් 2500ක පමණ දත්ත ප්‍රමාණයක් පද්ධතියට ඇතුළත් කිරීමට හැකි වුවද එවැනි සීමිත පිරිසක් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම ඵලදායි නොවන බැවින් එම කාර්ය 2022 වර්ෂය සඳහා කල් දමන ලදි.
(ආ) දේශීයත්වය මත පදනම් වූ කෘෂිභාග ගෙවීම් සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් රු. 3,000,000ක් වෙන් කර තිබුණද, වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	සැලසුම් කල කාර්යයන් නියමිත පරිදි ඉටු කල යුතුය	ව්‍යාපෘතියට 2021 වර්ෂයේ අයවැය මගින් රු.මි.03ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද රු. මි 01 අහුරා නබන ලදි. ඒ අනුව රු. මි 02 ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට වෙන්කර ඇත. නමුත් වර්ෂය පුරා රටේ පැවති Covid 19 වසංගතය හමුවේ පැවැති බාධා හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

3.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය පිහිටුවීමට	ව්‍යවස්ථාපිත මණ්ඩලය	ආයතනික බල ප්‍රදේශයේ උරුමය, ඓතිහාසික, සාමාජීය වැනි අවශ්‍යතා

	අදාල අපේක්ෂිත අරමුණු හා එකග නොවන ප්‍රදේශයේ තෝරාගත් දහම් පාසල් සඳහා පුස්තකාල ග්‍රන්ථ බෙදාදීමේ වැඩසටහනක් රු.2,538,862ක් වැයකර වර්ෂය තුල ක්‍රියාත්මක කර නිබුණි.	පිහිටුවීමට අදාල අපේක්ෂිත අරමුණු හා එකග වන කාර්යයන් සිදු කල යුතුය.	සඳහා කටයුතු කළ යුතු බව සඳහන් වේ. ඒ අනුව ව්‍යාපෘතිය යටතේ බෙදාදීමට තෝරාගෙන ඇති පොත් ලැයිස්තුව ඉහත ආයතනික අරමුණුවලට පටහැනි නොවන බව නිරීක්ෂණය කරමි.
(ආ)	කන්ද උඩරට උරුමය ආශ්‍රිතව ලේඛක අත්වැල වැඩසටහනෙහි අරමුණු වූ කන්ද උඩරට උරුමය හා වටිනාකම්, ඓතිහාසික සංසිද්ධීන් හා සමාජ සම්බන්ධතා පිළිබඳ දැනුම පුළුල් ලෙස සමාජගත කිරීමට පටහැනිව වෙනත් ග්‍රන්ථ මිලදී ගෙන නිබුණි	ව්‍යවස්ථාපිත මණ්ඩලය පිහිටුවීමට අදාල අපේක්ෂිත අරමුණු හා එකග වන කාර්යයන් සිදු කල යුතුය.	ආයතනයේ අරමුණු සමාජ සම්බන්ධතා පිළිබඳ දැනුම පුළුල් ලෙස සමාජගත කිරීම වූ බැවින් ඉදිරිපත් කරනු ලැබූ කෘතීන් උරුමයට අදාළ වන්නා වූ විද්වත් මණ්ඩලයක් මඟින් තෝරා දෙන කෘතීන් වේ.

3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම සහ කලාකරුවන් හා සේවාලාභීන් සම්බන්ධීකරණය කෙරෙන ඩිජිටල් යොමු නිර්මාණය කිරීම විගණිත දින වන විටත් පරිශීලකයන්ට භාවිතා කළ හැකි ආකාරයට නිර්මාණය කර නොතිබුණි.	සැලසුම් කල කාර්යයන් නියමිත පරිදි ඉටු කල යුතුය.	අමාත්‍යාංශ වෙබ් අඩවිය තුළ කලාකරු දත්ත පද්ධතිය ක්‍රියාත්මක නත්වයේ පවතී. කලාකරුවන් සඳහා මාර්ගගත ක්‍රමයට (online) දත්ත පද්ධතියෙහි ලියාපදිංචි වීමට හා අවශ්‍ය අයෙකුට කලාකරු තොරතුරු දත්ත පද්ධතියට පිවිස ලබා ගැනීමට හැකිය. එයට සමගාමීව නිබෙන කලාකරු ඩිජිටල් යෙදුම් දෙකෙහි සියලු නිර්මාණ කටයුතු නිමවා නිබුනද එය App Store සහ Play Store සඳහා දැනට ස්ථාපනය කර නැත. එය භාවිතාවට ගැනීම සඳහා යටිතල පහසුකම් රාශියක් සම්පූර්ණ කළ යුතු බැවින් ඒ සඳහා යම් කාලසීමාවක් වැයකිරීමට සිදුවේ.

3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාව අනුව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 100% ක් ලෙස දක්වා තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියන හා උපකරණ වටිනාකම් ලෙස දැක්වුණු රු.25,235,066 තුල අමාත්‍යාංශය සතුව පවතින වාහන 19 ක වටිනාකම් ඇතුලත් කර නොතිබීම හේතුවෙන් එම ප්‍රගතිය 100% ක් නොවන බව නිරීක්ෂණය විය.	අමාත්‍යාංශය සතු පවතින වාහන 19හි වටිනාකම් නක්සේරු කර ගිණුම්ගත කල යුතුය.	2020.08.09 දින මෙම අමාත්‍යාංශය ස්ථාපිත කරන අවස්ථාවේ සිට ස්ථිරවම කිසිදු රථවාහනයක් අයත්ව නොතිබුණු අතර දැනට වාහන මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.
(ආ)	අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ව්‍යාපෘති 11ක් දක්වා තිබුණ ද කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි.	අමාත්‍යාංශය සඳහා කාර්යසාධන දර්ශක හඳුනාගත යුතුය.	මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 02/2020ට අනුව නොරතුරු ඇතුළත් කර මූල්‍ය ප්‍රගතිය ද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර ඇත. (මෙම ව්‍යාපෘති වල ස්වභාවය අනුව නිමැවුම් දර්ශකයම කාර්ය සාධන දර්ශකය වන බැවින් නිමැවුම් දර්ශකය පමණක් ඇතුලත් කර ඇත.)
(ඇ)	කාර්යසාධන වාර්තාවේ එක් එක් ව්‍යාපෘතිවල ප්‍රගතිය දැක්වීමේදී භෞතික ඉලක්ක, ලභාකර ගැනීම් හා භෞතික කාර්යසාධනය ප්‍රතිශතයක් ලෙස නිශ්චිතව දක්වා නොතිබුණි.	ව්‍යාපෘතිවල ප්‍රගතිය දැක්වීමේදී භෞතික ඉලක්ක, ලභාකර ගැනීම් හා	2021 කාර්යසාධන වාර්තාවට අනුව අපේක්ෂිත නිමැවුම් යටතේ භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස සටහන් කර ඇත. මෙම ව්‍යාපෘතිවල ස්වභාවය අනුව භෞතික ප්‍රගතිය නිශ්චිත අගයක් සටහන් කිරීම ප්‍රායෝගික ව අපහසු බැවින් ප්‍රතිශත පරාසයක් තුල සඳහන් කර ඇත. මූල්‍ය

		භෞතික කාර්යසාධනය දැක්විය යුතුය.	ප්‍රගතියේ සහ භෞතික ප්‍රගතියේ විස්තරාත්මක සටහන් වෙනත් තීරුවේ සටහන් කර ඇත.
(ඇ)	වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි ඇතුලත් අනුකූලතා වාර්තාවේ පහත සඳහන් අයිතම අනුකූල බවට සාවද්‍ය නොරතුරු දක්වා තිබුණි. 1. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම 2. බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම 3. ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම 4. මු.රෙ.94(1) ප්‍රකාරව ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	කාර්යසාධන වාර්තාවේ නිවැරදි නොරතුරු ඉදිරිපත් කල යුතුය.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි පොදු උපදෙස්හි 8.1 වගන්තියෙහි සඳහන් වන පරිදි සිගාස් වැඩසටහන මඟින් ස්ථාවර වත්කම් ලැයිස්තුව ලබා ගන්නා බැවින් මෙම අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු නොලබයි. 2021 වර්ෂයේ බැරකම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි. රන්මිණිතැන්න කාර්යාල සඳහා මිලදි ගන්නා ලද පරිගණක රන්මිණිතැන්න සඳහා වෙන් වී ඇති 401-2-3-10-1509 වැය විෂය යටතේ ඇතුළත් කර ඇත.
(ඉ)	සුවිශේෂ අනන්‍යතාවයකින් සහිත ප්‍රජාව/ ස්වදේශික ජනතාව සංරක්ෂණය කිරීම ව්‍යාපෘතිය සඳහා රු.10,000,000ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද, එම මුදල් උපයෝජනය කිරීමට අපේක්ෂිත කාර්යයන් නිශ්චිතව සඳහන් නොවූ අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.6,825,919ක, එනම් 76%ක ප්‍රතිපාදන ඉතිරියක් නිරීක්ෂණය විය. එමෙන්ම වාර්ෂික කාර්යසාධන වාර්තාවේ නිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ ප්‍රගතිය යටතේ කාර්යන්හි ප්‍රගතිය 75%-100% ලෙස දක්වා තිබුණද, කාර්යසාධනය දැක්වෙන වාර්තාවේ (පරිච්ඡේදය 04) ප්‍රගතිය 50%-74% ලෙස දක්වා තිබුණි.	කාර්යසාධන වාර්තාවේ නිවැරදි නොරතුරු ඉදිරිපත් කල යුතුය.	දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු.මි.7.1 ප්‍රතිපාදන වෙන් කල ද පැවති covid 19 වසංගතය හේතුවෙන් සැලසුම් කල පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත ප්‍රතිපාදන ඉතිරි විය. (වෙන් කල ප්‍රතිපාදන රු.මි.3.1 ක වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර එම ප්‍රමාණය බැරකම් වී ඇත.) 2021 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ පරිච්ඡේදය 04 හි කාර්යසාධන දර්ශක ක්‍රියාකාරී සැලැස්ම පදනම් කර ගෙන සකස් කර ඇති අතර එහි ප්‍රගතිය 50%-74% ලෙස දක්වා ඇත. පරිච්ඡේද 05 හි සඳහන් වනුයේ නිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද එක් එක් වැඩසටහන් හි මේ දක්වා ජයග්‍රහණ කර ඇති ප්‍රගතිය 100% බවයි.

3.7 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1 ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවද පහත ප්‍රසම්පාදනයන් 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. 1.පිරිවැය රු.2,000,000 ක් වූ මගින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම 2.නෙළුම් පොකුණ රහහලේ ප්‍රසම්පාදන කාර්යයන් 3.ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් නාක්ෂණය හඳුන්වා දීමට අදාලව ජාතික උරුම නියෝජනය වන ආකාරයේ UBS pen drive උපාංගයක් නිර්මාණය කිරීම. 4.ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් නාක්ෂණය හඳුන්වා දීමට අදාලව විදුලුත් මාධ්‍ය තුල සංරක්ෂිත ජාතික උරුම නියෝජනය වන ආකාරයේ විඩියෝ පට ප්‍රති-නිෂ්පාදනය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතුය.	1.2021.12.28 සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා ඇත. 2. නෙළුම් පොකුණ රහහල 2021 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොමැත. උපදෙස් ලබා දීම මගින් 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් මේ වන විට සකසා ඇත. 3, 4. මෙම කාර්යයන් අතපසු වීමකින් 2021 මුල් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොමැත. පසුව රටේ පැවති කොවිඩ් තත්වය හේතුවෙන් මෙම කාර්යයන් කිරීම නවතා දමන ලද බැවින් 2021 සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මටද ඇතුළත්ව නොමැත.
(ආ)	අපේ ගම පරිශ්‍රය සඳහා ආරක්ෂක පහසුකම් ලබා ගැනීමේදී, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා ආයතනය වෙතින් අදාල සේවාව ලබාගෙන තිබූ	ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා අවශ්‍ය සේවාවන් ලබා ගත යුතුය.	සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා ආයතනය සමඟ ගිවිසුම් ගතවීමට කටයුතු කරමින් පවතී.

අතර සේවා ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) ආයතන සඳහා සේවා ලබාගැනීම වාර්ෂිකව සිදුකල යුතු වුවද,

1. කන්ද උඩරට උරුමය සුරැකීම් සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය සඳහා ලබා ගෙන තිබූ ආරක්ෂක සේවාව හා පවිත්‍රතා සේවාව සඳහා වන ගිවිසුම් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වුවද, 2022 වර්ෂය සඳහා නව සේවා ආයතනය තෝරාගෙන ගිවිසුම් වලට එළඹීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබූ අතර අදාළ සේවා ගිවිසුම් 2022 පෙබරවාරි 28 දින මාස දෙකකින් දීර්ඝ කර තිබුණි.

2. නෙළුම් පොකුණ රහහල සඳහා වන රක්ෂණ ගිවිසුමේ කාල සීමාව 2020 දෙසැම්බර් 17 දිනෙන් හා පිරිසිදු කිරීමේ සේවය ලබා ගැනීමේ කාල සීමාව 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් වුවද, නව සේවා ලබාගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු නිසි කලට ආරම්භ කර නොතිබූ අතර අවස්ථා දෙකකදී රක්ෂණ ගිවිසුම් මාස 04 කින් දීර්ඝ කිරීම සඳහා සහ පිරිසිදු කිරීමේ සේවා ගිවිසුම් මාස 02 කින් දීර්ඝ කර තිබුණි.

වාර්ෂිකව සේවා ලබාගැනීම් සඳහා ප්‍රසම්පාදන කටයුතු කාල සටහනකට අනුව සිදු කල යුතුය.

කන්ද උඩරට උරුමය සුරැකීම් සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ අපේක්ෂිත පවිත්‍රතා සේවා ගිවිසුම් මාස දෙකකින් දීර්ඝ කිරීමට කටයුතු කරන ලද්දේ එවකට සුළු ප්‍රසම්පාදන කම්වුවේ සභාපතිට කොවිඩ් වැළඳීම් හේතුවෙනි.

(ඈ) "අපේ ගම" ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය සඳහා ව්‍යාපාර සහ සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේදී මිල පමණක් පදනම් කරගෙන ලංසු

ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව

අදාල විශේෂඥ දැනුම් ඇති සම්පත් දායකයකු තෝරා ගැනීමේදී ආයතන තුනක් මිල ගනන් එවා තිබිණි. එහිදී තෝරාගත් ආයතනය ආයෝජන

ඇගයීම් සිදුකර ලංසුකරු තෝරාගෙන තිබුණි.	කටයුතු කල යුතුය.	සැලැස්ම සකස් කරනු ලබන සම්පත් දායකයාගේ සුදුසුකම් හා ජීවදන්න තොරතුරු ඇතුලත් කර තිබිණි. අනෙකුත් ආයතන මිල ගනන් පමණක් ඉදිරිපත් කර තිබිණි. ඒ අනුව එම ආයතනය විසින් ඉදිරිපත් කල මිල ගනන් සහ සම්පත් දායකයාගේ වෘත්තිය සුදුසුකම්, පළපුරුද්ද සැළකිල්ලට ගෙන කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.
(ඉ) නෙළුම් පොකුණ රහහලට ගමන් මළු පරීක්ෂණ යන්ත්‍රයක් (Baggage Scanner) මිලදී ගැනීම සඳහා නාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කල පිරිවිතරයන් අනුව විකිණීමෙන් පසු සේවා කාලය වසර 10 ක් විය යුතු වුවද, සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ මිලගණන් වල වගකීම් කාල සීමාව වසර 05 ක් හා එය ඉක්මවූ පසු එකතුව රු.3,196,520 ක් පිරිවැය වන සේවා ගිවිසුමක් ඇතිකර ගත යුතු විය. එසේ වුවද, එම පිරිවැයද ඇතුලත්ව සමස්ථ පිරිවැය මිලගණන් ඇගයීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.	ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.	වගකීම් කාලය අවසානයේ වගකීම් කාලසීමාව දික් කර ගැනීම හෝ සේවා සැපයීමේ සේවා ගිවිසුම හෝ අමතර කොටස් පමණක් මිලදී ගනිමින් යන්ත්‍රයේ නඩත්තු හා සේවාවන් මෙම රහහලෙහි නාක්ෂණික නිලධාරීන් මඟින් සිදු කරන්නේ ද නැද්ද යන්න තීරණය කිරීම වගකීම් කාලය අවසන් වීමත් සමග රහහල මඟින් සිදු කරනු ලබන බැව් පෙන්වා දෙමි.
(ඊ) මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.		
1. ලංසු ඇගයීම් ලේඛන නිවැරදිව, නිරවුල්ව සකස් කිරීම, සමාලෝචනය කිරීම හා අනුමත කිරීම නාක්ෂණික ඇගයීම් කමිටුවේ වගකීම හා කාර්යභාරය වුවද ලංසු අගයන අවස්ථාවේදී වෙබ් අඩවිය නිමා කිරීමට ගන්නා කාලය ප්‍රායෝගිකව ප්‍රමාණවත් නොවන බව ලංසු අගයන අවස්ථාවේදී සඳහන් කිරීමෙන්	ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.	අදාළ කාර්යය සති දෙකක් තුළ අවසන් කළ හැකි බව ලංසු ලේඛණ පිළියෙළ කරන අවස්ථාවේ දී නාක්ෂණික ඇගයුම් කමිටුවේ නිරීක්ෂණය විය. එම කාලය ප්‍රමාණවත් නොවන්නේ යයි පසු අවස්ථාවක නාක්ෂණික ඇගයීම් කමිටුව හඳුනාගැනීමක් සිදු කර නැත. සුදුසුකම් ලත් ලංසුකරු විසින් දක්වා තිබූ සති 06 ක කාලය ලබා දීම ව්‍යාපෘතිය

අමාත්‍යාංශයේ නාක්ෂණික ඇගයීම් කමිටුව වගකීම පැහැර හරිමින් කටයුතු කර තිබුණි.		වර්ෂාවසානයට පෙර නිම කිරීම සඳහා බාධාවක් නොවන බැවින් එම ආයතනයේ ඉල්ලීමට ඉඩ දීම පමණක් සිදු කර ඇති අතර ලංසු ලේඛණ කැඳවා තිබූ සියලු ආයතනවලට ඒ බව දැනුම් දීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුණි.
2. පළමුව නාක්ෂණික යෝජනාව ඇගයීමට ලක් කර ඒ සඳහා සියයට 60 ක් හෝ ඊට වැඩි ලකුණු මට්ටමක් ලබාගන්නා ලංසුකරුවන් පමණක් දෙවන අදියරේදී මූල්‍ය යෝජනා ඇගයීමට ලක්කල යුතු වුවද ලංසුකරුවන් නිදෙනා එම නිර්ණායක යටතේ ඇගයීමට ලක්කර ලකුණු ලබාදී නොතිබුණි.	ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.	නාක්ෂණික ඇගයුම් කමිටු වාර්තාව අනුව ලංසු ඉදිරිපත් කළ Innovation ආයතනය විසින් අත්‍යවශ්‍ය අංග වන Design හා Technical Proposal ඉදිරිපත් කර නොතිබීමත්, Interminal Technologies ආයතනය Design Sample හා කොන්ත්‍රාත් නිම කිරීමට ගත වන කාලය යන අත්‍යවශ්‍ය අංග ඉදිරිපත් නොකිරීමත් හේතුවෙන් මූලික වටයේදීම ප්‍රතික්ෂේප වූ අතර Fixel Digital ආයතනය එම සියළු අංග සහිතව ලංසුව ඉදිරිපත් කර තිබූ බවට නාක්ෂණික ඇගයුම් කමිටුව සැඟීමට පත් වූ බැවින් එය තෝරා ගෙන ඇත.
3. තෝරාගන්නා ලද ලංසුකරු ලංසු ඉදිරිපත් කිරීමේදී නාක්ෂණික යෝජනාව හා මූල්‍ය යෝජනාව ඇතුලත් සිල් නබන ලද ලියුම් කවර පිටත ලියුම් කවරයක බහා ලංසු ඉදිරිපත් කර නොතිබීම, කාර්යය සඳහා යොදවන කණ්ඩායම් සාමාජිකයන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබීම හා ආයතනයේ ලිපි ශීර්ෂයකින් බලය ලත් නිලධාරියෙකුගේ අත්සනකින් ලංසුව ඉදිරිපත් කර නොතිබීම යන හේතු මත ප්‍රතික්ෂේප කළ යුතුව තිබුණද සම්බන්ධයෙන් නාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව එම	ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.	Fixel Digital ආයතනය විසින් Technical proposal හා Financial proposal ලෙස වෙන් වෙන් වශයෙන් කවර වල බහා තිබූ අතර එය කවර ඉහළ කෙලවරේ සඳහන් කර තිබුණි.

ලංසුකරු තෝරාගෙන තිබුණි.

3.8 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
රාජ්‍ය අමාත්‍යාංශයේ වෙක්පත් අත්සන් කරනු ලබන නිලධාරීන් වෙතින් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාල නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර යුතුය.	මෙම අමාත්‍යාංශය අලුතින් ඇති කරන ලද අමාත්‍යාංශයක් බැවින් ඇප තැබීම් කටයුතු මේ දක්වා සිදු කර නොමැති අතර එම කටයුතු මේ දිනවල සිදු කරමින් පවති.

3.9 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩල කාර්යාල පරිශ්‍රය සඳහා මහනුවර මහ නගර සභා සීමාව තුල පිහිටි ගොඩනැගිල්ලක් බදු කුලී පදනමට ගෙන තිබූ අතර සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශය විසින් අත්සන් කල පලමු ගිවිසුම 2020 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් වුවද, ඒ වන විට නව ස්ථානයක් තෝරා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබූ බැවින් එම ගිවිසුම 2021 ජනවාරි 31 දක්වා මාස 3කින් දීර්ඝ කර තිබුණි. කාර්යාල පරිශ්‍රය සඳහා අවශ්‍ය බිම් ප්‍රමාණය වර්ග අඩි 3400 වුවද කලින් ගිවිසුම් මාස 03 කට දීර්ඝ කිරීම හේතුවෙන් වර්ග අඩි 6039 සඳහා ගිවිසුම් ගත වීමට සිදුව තිබූ අතර ඒ අනුව අතිරේකව ගෙවන ලද රු.18,000,000 ක වියදම අමාත්‍යාංශයට සිදුවූ පාඩුවක් විය.	අතිරේකව ගෙවන ලද රු.18,000,000 ක මුදල ආවරණය කර ගැනීමට පියවර ගත යුතුය.	2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගතය හමුවේ නිලධාරීන් සේවයට කැඳවා ගැනීමට තිබූ අපහසුතාවය හේතුවෙන් නියමිත දිනට ප්‍රසම්පාදන කටයුතු කිරීමට නොහැකි වී ඇත. එහෙත් කාර්යාල කටයුතු බාධාවකින් තොරව සිදු කර ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන තෙක් ගිවිසුම් මාස 3කින් දීර්ඝ කර ඇත.

(ආ)	නෙළුම් පොකුණ රහහල සඳහා ගමන්මළු පරීක්ෂණ යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාලව එක් ආයතනයක් ලංසු 02 ක් ඉදිරිපත් කර තිබූ අතර රු.2,999,000ක මිල පලමු ලංසුව ලෙසත්, රු.5,400,000ක මිල දෙවන ලංසුව ලෙසත් ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් සටහන් කර තිබුණි. නමුත් නාක්ෂණික ඇගයීම් කමිටුව රු.5,400,000 මිල පලමු ලංසුව ලෙසත් රු.2,999,000 මිල සහිත ලංසුව දෙවන ලංසුව ලෙස සටහන් කර ලංසු ඇගයීමේදී දෙවන ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. මෙහිදී වෙනත් ආයතනයක් ඉදිරිපත් කර තිබූ රු.4,800,000ක මිල අවම මිල ලෙස පිළිගෙන යන්ත්‍රය එම සමාගමෙන් මිලදී ගැනීමට නිර්දේශ කර තිබීමෙන් රු.1,801,000 ක මූල්‍යමය පාඩුවක් අමාත්‍යාංශය වෙත සිදුව තිබුණි.	ලංසු ඇගයීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.3.17 අනුව විකල්ප මිල ගණන් ඉදිරිපත් කිරීම එම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ.

3.10 අනාරක්ෂිත ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) නෙළුම් පොකුණ රහහල තුල පෞද්ගලික සන්නිවේදන ආයතන තුනක් මගින් පවත්වාගෙන යන සම්ප්‍රේෂණ ඇන්ටනා සඳහා සේවා සැපයීම වෙනුවෙන් බදුකුලී අයකිරීම සඳහා ගිවිසුම් වලට එළඹීමේදී 2015 වසරේ එකඟ වූ අගයන් සඳහාම 2020 වර්ෂයේදී බදු ගිවිසුම් වලට එළඹ නිබුණි. 2021 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව	නව තක්සේරු අගයන් මත බදු ගිවිසුම් වලට ඇතුලත් වීමට හා සන්නිවේදන ආයතන බැඳීම් වලට යටත් වන පරිදි ගිවිසුම්	සන්නිවේදන ආයතනයන් රහහල වෙත ගෙවිය යුතු බදු කුළිය හා විදුලි බිල් මේ වන විට නිරවුල් කර ඇත.එම ගිවිසුම් වල ප්‍රමාද ගෙවීම් සඳහා වන දඩ මුදලක් පැණවීම පිලිබඳ කොන්දේසියක් ඇතුලත් කර ගැනීමට ඉදිරි කටයුතු සිදු කරනු ලබන බැව් දන්වා සිටිමි.

	පෞද්ගලික සන්නිවේදන ආයතන තුන මඟින් නොගෙවන ලද බදුකුලී වටිනාකම රු.1,550,000 ක් සහ භාවිතා කල විදුලිය සඳහා අය විය යුතු මුදල රු.1,222,263 ක් විය. ගිවිසුම් වලට එළඹීමේදී බදු කුලිය ගෙවීම ප්‍රමාද වීම මත අයකල යුතු දඩ මුදලක් දක්වා නොතිබීමෙන් ප්‍රමාද දඩ අයකල නොහැකිව තිබුණි.	වලට එළඹීමට කටයුතු කළ යුතු වේ.
(ආ)	කන්ද උඩරට උරුමය පිළිබඳ ව්‍යවස්ථාපිත මණ්ඩලය ආරම්භයේ සිටම මාසිකව රු.1,000,000 ක බදු කුලියකට ලබා ගත්, මහනුවර මහ නගර සභා සීමාව තුල පිහිටි ගොඩනැගිල්ලක කාර්යාලය පවත්වාගෙන ගොස් තිබූ අතර, එම බදු කුලී ගිවිසුම 2020 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් පසු බදු කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීමට රාජ්‍ය අමාත්‍යාංශය විසින් ලංසු ආරාධනා කල විට, එම ගොඩනැගිලි පරිශ්‍රයම රු.500,000 ක මාසික බදු කුලියක් මත ලබා දීම සඳහා බදු දීමනාකරු විසින් ලංසු ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව මාසිකව රු.500,000ක කුලී මුදලකට ලබා ගත හැකිව තිබූ ගොඩනැගිල්ලක් සඳහා මාසිකව රු.1,000,000ක් බැගින් කුලි ගෙවා තිබූ අතර 2020 අප්‍රේල් සිට 2021 ජනවාරි දක්වා රාජ්‍ය අමාත්‍යාංශය රු. 10,000,000ක් ගොඩනැඟිලි කුලී ලෙස ගෙවා තිබුණද, එම පිරිවැයෙන් 50%ක් එනම් රු.5,000,000ක් අනාවශ්‍යකව වැයකර තිබුණි.	මෙවැනි අනාවශ්‍යක වියදම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	2020 ඔක්තෝබර් මසට පෙර කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ බදු කුලී පදනමට ලබා ගත් ගොඩනැගිල්ලේ වර්ග අඩි 6039 ක් වන මහල් 4 කින් යුතු මුළු ගොඩනැගිල්ලම ලක්ෂ 10ක මුදලකට මිල දී ගෙන තිබුණි. එහෙත් 2020 ඔක්තෝබර් මසට පසු එම ගොඩනැගිල්ලේ වර්ග අඩි 3400 ක ප්‍රමාණයක් එනම් මහල් 3 ක් (පහත මහලේ හැර) බදු ගැනීමට කටයුතු කර ඇත. ඒ සඳහා රුපියල් ලක්ෂ 5 ක් මාසිකව ගෙවීමට ගිවිසුම් අත්සන් කර ඇත.

3.11 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2022 ජූනි 30 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

	විගණන විමසුම පිළිබඳ විස්තරය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	අංකCAA/A/SMNH&PA/2021/04, 06/Q04 හා 2022 මාර්තු 08 දිනැති ජාතික ප්‍රාසාංගික කලා මධ්‍යස්ථානයේ මෙහෙයුම් හා පරිපාලන කටයුතු පරීක්ෂාව.	ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව සියළුම විගණන විමසුම් වලට නිශ්චිත කාල සීමාව තුල පිලිතුරු සැපයීමට කටයුතු කල යුතුය.	විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොමැති අතර එය සකස් කල වහාම විගණනයට ඉදිරිපත් කරමි.
(ආ)	අංකCAA/A/SMNH&PA/2021/04, /Q08 හා 2022 අප්‍රේල් 04 දිනැති කන්ද උඩරය උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ කටයුතු පරීක්ෂාව	ජාතික විගණන පණතේ විධිවිධාන ප්‍රකාරව සියළුම විගණන විමසුම් වලට නිශ්චිත කාල සීමාව තුල පිලිතුරු සැපයීමට කටයුතු කල යුතුය.	විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොමැති අතර එය සකස් කල වහාම විගණනයට ඉදිරිපත් කරමි.
(ඇ)	අංකCAA/A/SMNH&PA/2021/04, /Q10 හා 2022 අප්‍රේල් 20 දිනැති මූල්‍ය නොවන වත්කම් පිලිබඳ පරීක්ෂාව	ජාතික විගණන පණතේ විධිවිධාන ප්‍රකාරව සියළුම විගණන විමසුම් වලට නිශ්චිත කාල සීමාව තුල පිලිතුරු සැපයීමට කටයුතු කල යුතුය.	විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොමැති අතර එය සකස් කල වහාම විගණනයට ඉදිරිපත් කරමි.
(ඈ)	අංකCAA/A/SMNH&PA/2021/04, /Q11 හා 2022 අප්‍රේල් 29 දිනැති මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි සිනමා උද්‍යානයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම පිලිබඳ පරීක්ෂාව	ජාතික විගණන පණතේ විධිවිධාන ප්‍රකාරව සියළුම විගණන විමසුම් වලට නිශ්චිත කාල සීමාව තුල පිලිතුරු සැපයීමට කටයුතු කල යුතුය.	විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොමැති අතර එය සකස් කල වහාම විගණනයට ඉදිරිපත් කරමි.
(ඉ)	අංකCAA/A/SMNH&PA/2021/04, /Q12 හා 2022 මැයි 09 දිනැති මූල්‍ය	ජාතික විගණන පණතේ විධිවිධාන ප්‍රකාරව සියළුම	විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොමැති අතර එය සකස් කල වහාම

	වාර්තා 2021 පිලිබඳ පරීක්ෂාව	විගණන විමසුම් වලට නිශ්චිත කාල සීමාව තුල පිලිතුරු සැපයීමට කටයුතු කල යුතුය.	විගණනයට ඉදිරිපත් කරමි.
(ඊ)	අංකCAA/A/SMNH&PA/2021/04, /Q13 හා 2022 මැයි 17 දිනැති නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම පිලිබඳ පරීක්ෂාව	ජාතික විගණන පණතේ විධිවිධාන ප්‍රකාරව සියළුම විගණන විමසුම් වලට නිශ්චිත කාල සීමාව තුල පිලිතුරු සැපයීමට කටයුතු කල යුතුය.	විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොමැති අතර එය සකස් කල වහාම විගණනයට ඉදිරිපත් කරමි.
(උ)	අංකCAA/A/SMNH&PA/2021/04, /Q14 හා 2022 මැයි 18 දිනැති වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මකට අදාළ ප්‍රගතිය හා කාර්යසාධනය පිලිබඳ පරීක්ෂාව	ජාතික විගණන පණතේ විධිවිධාන ප්‍රකාරව සියළුම විගණන විමසුම් වලට නිශ්චිත කාල සීමාව තුල පිලිතුරු සැපයීමට කටයුතු කල යුතුය.	විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොමැති අතර එය සකස් කල වහාම විගණනයට ඉදිරිපත් කරමි.

3.12 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2020 නොවැම්බර් 20 දිනැති අංක 2202/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් අපේ ගම පරිශ්‍රය (අපේ ගම කාර්යාල පරිශ්‍රය හැර) ජාතික උරුම, ප්‍රසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට පවරා තිබුණ ද මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් අපේ ගම පරිශ්‍රය අමාත්‍යාංශයට පවරා දී තිබුණේ 2021 අප්‍රේල් 01 දින සිටය. පරිශ්‍රය මාස 04 කට වැඩි කාලයක් මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පැවැත්වීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබූ අදාල	අදාළ වියදම් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙතින් පියවා ගැනීමට කටයුතු කළ යුතුය.	අංක 2202/05 හා 2020.11.20 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව අපේ ගම පරිශ්‍රය ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයය පථයට පවරා ඇති නමුත් අපේ ගම පරිශ්‍රය පවත්වාගෙන යාම වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් වී නොතිබූ අතර, ඒ සඳහා කාර්ය මණ්ඩල අනුයුක්ත කිරීමක් ද සිදුව නොතිබුණි. එම කාලය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පරිපාලනය කිරීමට කටයුතු කර ඇත. එම මාස 04ක කාලය තුළ අපේ ගම

	කාලය තුල අපේ ගම පරිශ්‍රයෙන් උපයන ලද අදායම රු.1,264,500 ක් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පරිහරණය කර තිබුණි. අපේ ගම පරිශ්‍රය මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පැවති 2021 ජනවාරි සිට 2021 මාර්තු කාල සීමාවට අදාල සේවක වියදම්ද එම අරමුදල දැරිය යුතු වුවත් තුළ කම්කරු දීමනා වශයෙන් රු.254,000 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි.		පරිශ්‍රයේ කටයුතු වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල රු.8,516,759.80 ක මුදලක් වියදම් කර ඇත. කෙසේ වුවද 2021.04.01 දින සිට ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත විධිමත් පරිදි පවරා ඇත.
(ආ)	අපේ ගම පරිශ්‍රයට අවශ්‍ය කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමට මාස 06 ක් ප්‍රමාද වී තිබීම හේතුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් අනුයුක්ත කර තිබූ නිලධාරීන් නිදහස් 2021 අප්‍රේල් 05 දින සිට ඉදිරි මාස 03 ක කාලයක් සඳහා අනුයුක්ත කර ගැනීමට බුද්ධශාසන, ආගමික කටයුතු සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙතින් සිදුකල ඉල්ලීමට අනුමැතිය හිමි වී නොතිබුණි. එසේ තිබියදී රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් අධ්‍යක්ෂ සහ සහකාර කළමනාකරු යන තනතුරු සඳහා අනුයුක්තව සිටි නිලධාරීන් දෙදෙනාම 2021 අප්‍රේල් 01 දින සිට මාස 06 ක කාලයක් සඳහා තාවකාලිකව පත්කර තිබුණි.	කාර්ය මණ්ඩල අනුයුක්ත කිරීම අදාළ අනුමැතිය මත විධිමත්ව සිදු කිරීමට කටයුතු කළ යුතුය.	2020.11.20 දින සිට අපේ ගම පරිශ්‍රය බිඳවැටීමකින් තොරව පවත්වා ගෙන යාම සඳහා අනුයුක්ත කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් රාජ්‍ය අමාත්‍යාංශය වෙත අනුයුක්තව නොසිටි බැවින් සහ කිසිදු ප්‍රතිපාදනයක් රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අයවැය ඇස්තමේන්තුව යටතේ වෙන්කර නොමැති බැවින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ එකඟතාවය ද සහිතව 2021.03.31 දින දක්වා අපේ ගම පරිශ්‍රය මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේම පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. මේ සඳහා බුද්ධශාසන ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් 2020.12.16 දින උපදෙස් ලබාදෙන ලදී.
(ඇ)	අපේ ගම පරිශ්‍රය පිහිටි අක්කර 13 රූඩ් 03 පර්චස් 25.1 කින් යුත් භූමියේ හිමිකම හා එහි ගොඩනැඟිලි යනාදිය නාගරික හා නිවාස අමාත්‍යාංශය යටතේ වන නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	භූමියේ හිමිකම විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2021.12.14 දිනැති අංක AG/01/08 ලිපියෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිට පිටපත් සහිතව නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීමේ සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

			වෙත අපේ ගම පරිශ්‍රයට අයත් ඉඩම පැවරීමට කටයුතු කරන ලෙස දන්වා යවා ඇත.
(ඇ)	අපේ ගම පරිශ්‍රය වෙන් කිරීමේදී සියයට 10 ක සේවා ගාස්තුවක් අයකර නිබුණද ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. මහවලව්ව සහ ශ්‍රවණාගාර පරිශ්‍ර වෙන් කරදීමේදී සියයට 50 ක ආරක්ෂක තැම්පතුව ලබාගෙන නොතිබුණි.	නියමිත ගාස්තු හා තැන්පතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	මේ වනවිට වෙන්කිරීම් සඳහා 10% ක සේවා ගාස්තුවක් අයකරනු නොලැබේ. මහවලව්ව හා ශ්‍රවණාගාරය වෙන්කිරීමේදී දේපලවල ආරක්ෂාව සඳහා මුළු මුදලින් 50%ක තැන්පත් මුදලක් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.
(ඉ)	අපේ ගම පරිශ්‍රයේ මහ වලව්ව ගොඩනැගිල්ලට අදාළ විදුලි බිල්පත්වල හිඟය වෙනුවෙන් පොළී අයකර නිබු අතර 2021 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා අය කරන ලද පොළිය රු.6,777 ක් විය.	විදුලි බිල්පත්වල හිඟය වෙනුවෙන් වූ පොළිය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය.	2021 වසර සඳහා අපේ ගම පරිශ්‍රය වෙත මූල්‍ය ප්‍රතිපාදනවෙන් වී නොතිබු අතර රාජ්‍ය කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මඟින් මෙම බිල්පත් ගෙවීම් කරන ලදී. අපේ ගම පරිශ්‍රය රජයේ ආයතනයක් වන බැවින් එම හිඟ මුදලට පොලි අය කිරීමට කටයුතු නොකරන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයේ බත්තරමුල්ල ශාඛාවේ ප්‍රාදේශීය ඉංජිනේරු වෙත 2022.02.07 දිනැතිව අපේ ගම පරිශ්‍රයේ අධ්‍යක්ෂ විසින් දන්වා ඇත.
(ඊ)	2020 ජනවාරි 09 දිනැති අංක SA/AMP/Deposit/Transfer දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් ලබාදුන් උපදෙස් ප්‍රකාරව නෙළුම් පොකුණ රහහල වෙනම ව්‍යාපෘතියක් ලෙස සලකා, එය නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අයවැය මඟින් සලසා ගැනීමටත් උපයන ලද ආදායම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා සුදුසු ආදායම්	රහහල වෙනම ව්‍යාපෘතියක් ලෙස සලකා, එය නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අයවැය මඟින් සලසා ගැනීමටත් උපයන ලද ආදායම රාජ්‍ය	2020 වර්ෂයේ ප්‍රතිපාදන සඳහා සුදුසු වැය විෂයක් ලබා දී කටයුතු කරන ලෙස අය වැය දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂක ජනරාල් උපදෙස් ලබා දී නිබු අතර එවකට නෙළුම් පොකුණ අයිතිව පැවතියේ සංස්කෘතික අමාත්‍යාංශයට වේ. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මෙම විෂය භාරව කටයුතු කළ අධ්‍යක්ෂතුමිය

	ශීර්ෂයකට බැර කිරීමටත් විගණන දින දක්වා කටයුතු කර නොතිබූ අතර අංක 6000-0-0-020-009-0 දරන නැන්පත් ගිණුම මගින් ගණුදෙනු මෙහෙයවා තිබුණි. එහිදී රහහලේ වැටුප්, ආරක්ෂණ හා නඩත්තු වියදම් ත්‍රිවිධ හමුදාවලින් දරා නිබීම හේතුවෙන් රහහලේ වියදම් ලෙස ඇතුලත්ව නොතිබූ අතර රහහලේ මූල්‍ය ප්‍රතිඵලයේ පවතින විශාල ඌණතාවය අනාවරණය කරද නොතිබුණි.	මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා සුදුසු ආදායම් ශීර්ෂයකට බැර කිරීමටත් පියවර ගත යුතුය.	ස්ථාන මාරු වී යාම හේතුවෙන් හා නෙළුම් පොකුණ ජාතික උරුම රාජ්‍ය අමාත්‍යාංශයට පැවරීම් හේතුවෙන් මෙම කටයුතු නාවකාලාකව නැවති ඇත. ඉදිරියේ දී එම කාර්යය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වමි.
(ඇ)	නෙළුම් පොකුණ රහහල කුලී පදනම් මත ලබා දීමේදී අදාල කුලී ගැනුම්කාර පාර්ශව සමඟ ගිවිසුම්වලට එළඹ තිබුනද, රහහල විධිමත් නෛතික පුද්ගලභාවයක් සහිත ආයතනයක් ලෙස ස්ථාපනය කිරීමට විගණන දින දක්වා කටයුතු කර නොතිබීම හේතුවෙන් එම ගිවිසුමෙහි නෛතික වලංගුභාවයක් නොපැවතුණි.	නෙළුම් පොකුණ රහහල විධිමත් නෛතික පුද්ගලභාවයක් සහිත ආයතනයක් ලෙස ස්ථාපනය කිරීමට කටයුතු කල යුතුය.	නිරීක්ෂණය සමඟ එකඟ වේ. විධිමත් ආයතනයක් ලෙස නෙළුම් පොකුණ රහහල ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව කටයුතු සිදු කරමින් පවතී.
(ඈ)	කොවිඩ් 19 පැතිරීම හේතුවෙන් රට තුල නිරෝධායන ඇදිරිනීතිය පනවා තිබූ 2021 මැයි හා ජුනි මාසවල රහහලේ විදුලි පරිභෝජන වියදම පිලිවෙලින් රු.1,448,590 ක්, රු.1,261,714ක් වැනි ඉතා ඉහල අගයන් ගෙන තිබූ අතර ක්‍රියාකාරකම් කිසිවක් සිදුකර නොතිබූ 2021 සැප්තැම්බර් මාසයේද විදුලි වියදම 1,519,859ක් වැනි ඉහල අගයක් ගෙන තිබුණද ඊට හේතු අනාවරණය නොවිය. තවද මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් අය ක්‍රමය වූ General Purpose – 03 මනු කියවීම් වර්ගයෙන් ඒකකයට අයකරන මීල ඉතා ඉහල අගයක් ගෙන තිබුණද මෙම අයක්‍රමය වෙනස්කරගෙන විදුලි ගාස්තු අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	විදුලි ගාස්තු අඩුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර යුතුය.	මෙම කල සීමා තුල නිළධාරීන්ට ඉන් පිටතට යාම නොදීම හේතුවෙන් එම නිලධාරීන් පැය 24 තුලම රැඳි සිටීම නිසා විදුලි බුබුළු, විදුලි පංකා ක්‍රියාත්මක කර ඇත . ඊට අමතරව නෙලුම් පොකුණ නඩත්තු කටයුතු සඳහා අන්සන් කරඇති දෙවන අවබෝධතා ගිවිසුම් අනුව එම කල සීමාව තුල Sound system, Lighting System, CCTV යනාදියගේ ප්‍රතිස්ථාපනය වීන සමාගම විසින් මේ දින වල සිදු කර ඇත. ඒ බැවින් මේ කාලය තුලදී විදුලි බිල අඩු වී නොමැති බව කාරුණිකව දන්වමි.

(ඒ)	2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 දරන ගැසට් පත්‍රය මගින් ග්‍රාමීය ජනකලා කේන්ද්‍රය රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා තිබුණද කේන්ද්‍රය නීත්‍යානුකූලව ස්ථාපිත කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන නොතිබුණි.	ග්‍රාමීය ජනකලා කේන්ද්‍රය නීත්‍යානුකූලව ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.	ජනකලා කේන්ද්‍රය 2020.08.09 වන දින වන විටත් පනතක් මගින් විධිමත් පරිදි ස්ථාපිත කර ඇත.
(ඓ)	2021 අප්‍රේල් 11 දිනැති අංක CDD/MISC/CASE/127/2020 දරණ ලිපිය අනුව ශ්‍රී ලංකා රේගුව විසින් අමාත්‍යාංශය වෙත මුදාහැරීමට නියමිතව පැවති රාජසන්තක කල වාහන දෙකක් අදාල ගාස්තු ගෙවා නිදහස් කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. වාහන නිදහස් කර ගැනීමට ප්‍රමාද වීම මත විශාල ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදුවන බව නිරීක්ෂණය වූ අතර 2021 අප්‍රේල් 29 දින වන විටත් අදාළ වාහන වෙනුවෙන් රු.1,376,462ක ප්‍රමාද ගාස්තුවක් ගෙවන ලෙස ඉන්වොයිස් මඟින් දැනුම් දී තිබුණි.	වාහන දෙක අදාල ගාස්තු ගෙවා නිදහස් කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු අතර ප්‍රමාද ගාස්තු වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය.	රාජ්‍ය සන්තක කර ඇති මෙම රථ වාහන රේගුවෙන් මෙම අමාත්‍යාංශය වෙත මුදා හැරීම සිදු කර ඇතත් ඒ සඳහා ගෙවිය යුතු ගාස්තු ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. ඒ සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. අදාළ ප්‍රතිපාදන මේ දක්වා ලැබී නැත.
(ඔ)	කන්ද උඩරට උරුමය පිළිබඳ නිසි ව්‍යවස්ථාපිත මණ්ඩලයක් /අධිකාරියක් පිහිටුවන තුරු, කන්ද උඩරට උරුමයන් සුරැකීමට අදාළ විශේෂ දැනුම ඇති 10 දෙනෙකුගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් පත් කර තිබූ අතර මෙම උපදේශන මණ්ඩලය 2020 සැප්තැම්බර් සිට 2021 දෙසැම්බර් දක්වා රැස්වී තිබුණේ එක් වරක් පමණි.	කන්ද උඩරට උරුමය පිළිබඳ නිසි ව්‍යවස්ථාපිත මණ්ඩලය /අධිකාරිය පිහිටුවිය යුතු අතර උපදේශක මණ්ඩලය සිය කාර්යභාරයන් ඉටුකල යුතුය.	උපදේශක මණ්ඩල සාමාජිකයින් ලෙස සිටින්නේ මෙරට ගෞරවනීය පුරවැසියන් මෙන්ම කාර්යබහුල අමාත්‍යාංශ හා ආයතන ප්‍රධානීන් වන අතර පැවති වසංගත තත්වයේදී ඔවුන් කැඳවීමෙදී විශාල අවධානමක් හා දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවීම සහ රජයේ මඟින් විටින් විට රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් ලබාදුන් සෞඛ්‍ය උපදෙස් නිසා තත්ත්වය සමනය වන තුරු උපදේශක මණ්ඩල රැස්වීම් පැවැත්වීම් කල් දැමීම් සිදුකරන ලදි.

4. නිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම

තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණු අතර අමාත්‍යාංශය ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හා ඒ යටතේ වන ක්‍රියාකාරකම් තිරසාර සංවර්ධන අරමුණු ලෙස දක්වා තිබුණි.	තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කල යුතුය.	පරිච්ඡේදයේ සංඝිප්ත වගුවේ හි පළවෙනි තීරුවේ ඒ ඒ ව්‍යාපෘතියට අදාළ තිරසර සංවර්ධන ඉලක්ක සටහන් කර ඇති අතර අමාත්‍යාංශය මගින් එම ඉලක්කය සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වල අරමුණු තිරසාර අරමුණු හා ගලපා සටහන් කර ඇත.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකිරීම සඳහා සැලසුම් සකස්කර හෝ අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගෙන හෝ නොතිබුණි.	අභ්‍යන්තර විගණනයක් සිදුකිරීම සඳහා පියවර ගත යුතුය.	මෙම අමාත්‍යාංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත නොමැති බැවින් එම තනතුර අනුමත කර දෙන ලෙස ඉල්ලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත . ඒ සඳහා මේ වන තෙක් අනුමැතිය ලැබී නැත. තනතුර අනුමත වූ වහාම අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

6. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිලිබඳ තොරතුරු

සේවා වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ මට්ටම	9	7	2
තෘතියික මට්ටම	3	0	3
ද්විතික මට්ටම	37	50	(13)
ප්‍රාථමික මට්ටම	13	5	8
එකතුව	62	62	0

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
අමාත්‍යාංශය සඳහා ජ්‍යෙෂ්ඨ, තෘතීක, ද්විතීක හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් පිලිවෙලින් 9, 3, 37 හා 13ක් බැගින් වන සේ 62 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය පිලිවෙලින් 7, 0, 50 හා 5ක් විය. ඒ අනුව ජ්‍යෙෂ්ඨ, තෘතීක හා ප්‍රාථමික මට්ටම් වලට අදාලව සේවකයන් 13 ක ඌණතාවයක් හා ද්විතීක මට්ටමට අදාළව නිලධාරීන් 13ක අතිරික්තතාවයක් පැවතුනි.	ජ්‍යෙෂ්ඨ, තෘතීක, ද්විතීක හා ප්‍රාථමික මට්ටම් සඳහා අනුමත සේවක සංඛ්‍යාව පවත්වා ගත යුතුය.	අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට අදාළ ද්විතීක මට්ටමේ අතිරික්ත නිලධාරීන් මෙම අමාත්‍යාංශයේ ඉල්ලීමකින් තොරව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් අනුයුක්ත කර ඇත. එම නිලධාරි අතිරික්තය පිළිබඳව අංක NH/AD/02/GT හා 2021.10.28 දිනැති ලිපිය මගින් එම අමාත්‍යාංශය දැනුවත් කර ඇත.

එච්. එම්.රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය 05

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

ජාතික උරුම අංශය යටතේ 2021 වර්ෂය සඳහා ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති 11 ක්‍රියාත්මක විය.

1. ජාතික උරුම පර්යේෂණ හා සංරක්ෂණ ඒකකයක් ස්ථාපනය කිරීම (ජාතික උරුම හඳුනා ගැනීම)
2. ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම
3. ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම
4. ආදීවාසි ජන උරුමයන් ආරක්ෂා කිරීම
5. දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන දැනුවත් කිරීමේ වැඩසටහන
6. දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන -දරුවන්ගේ කලා රසඥතා වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
7. දඹාන ජන උරුම මධ්‍යස්ථානය නඩත්තු කිරීම.
8. ග්‍රාමීය කලා ගම්මාන - ප්‍රසිද්ධ කලාකරුවන් ආශ්‍රය කරගත් කලා ගම්මාන නිර්මාණය කිරීම
9. දේශීයත්වය මුල් කරගත් කර්තෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යන්ත්‍රණයක් හඳුන්වා දීම
10. කලාකරුවන් සඳහා හදිසි අනතුරු හා වෛද්‍යාධාර රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම
11. කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම හා යාවත්කාලීන කිරීම

ඉහත ව්‍යාපෘතිවල කාර්යසාධනය පහත පරිදි වේ.

විශේෂිත දර්ශක	වාර්ෂික අයවැය ප්‍රතිපාදන (රු. මී)	මූල්‍ය ප්‍රගතිය		අපේක්ෂිත නිමැවුමේ			වෙනත්
		සත්‍ය වියදම (රු.)	වෙන් කළ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස	100% - 90%	75% - 89%	50% - 74%	
ජාතික උරුම පර්යේෂණ හා සංරක්ෂණ ඒකකයක් ස්ථාපනය කිරීම (ජාතික උරුම හඳුනා ගැනීම).	10	10,000,000.00	100%			√	අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වෙන් කළ ප්‍රතිපාදනයෙන් ඉතිරිය වීඩියෝ පට 30 ක් නිෂ්පාදන කිරීම සඳහා වෙන් කිරීමට තීරණය කරන ලදි.
ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම .	10	5,265,827.75	52.66%		√		වීඩියෝ 30 නිර්මාණය කිරීම සඳහා ප්‍රසම්පාදනයේදී තීරණය වූ මිල, ව්‍යාපෘතියේ ඉතිරි ප්‍රතිපාදන මුදලින් පියවා ගත නොහැකි වීම නිසා ජාතික උරුම පර්යේෂණ හා සංරක්ෂණ ඒකකයක් ස්ථාපනය කිරීම යන ව්‍යාපෘතියේ ඉතිරි වී තිබූ ප්‍රතිපාදන මෙම වීඩියෝ නිෂ්පාදනය සඳහා යෙදවීම හේතුවෙන් මෙම වැය ශීර්ෂයේ ප්‍රතිපාදන ඉතිරි විය .
ආදිවාසී / සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම .	9	2,174,081.34	24.16%			√	covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් බොහොමයක් ව්‍යාපෘතීන් සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම සහ ක්‍රියාත්මක කළ ව්‍යාෘතීන්ට අදාළ රු.මී. 3.1 ක වියදම් සඳහා අක්මුදල් නොලැබීම හේතුවෙන් මෙලෙස ප්‍රතිපාදන ඉතිරි විය .
ආදීවාසි ජන උරුමයන් ආරක්ෂා කිරීම.	2.5	2,253,882.71	90.16%	√			ප්‍රසම්පාදන කාර්ය මගින් අඩු ඇස්තමේන්තුගත මුදලක් යටතේ අස්ථි ප්‍රදර්ශන මැදිරියේ වැඩ කටයුතු නිමා කිරීමට හැකි වීම.
දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන දැනුවත් කිරීමේ වැඩසටහන .	3.5	3,500,000.00	100%	√			මෙය අඛණ්ඩව සිදුවන ව්‍යාපෘතියකි . 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.

විශේෂිත දර්ශක	වාර්ෂික අයවැය ප්‍රතිපාදන (රු.)	මූල්‍ය ප්‍රගතිය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			වෙනත්
		සත්‍ය වියදම (රු.)	වෙන් කළ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස	100% - 90%	75% - 89%	50% - 74%	
දැයේ උරුමය දරුවන්ටයි වැඩසටහන - දරුවන්ගේ කලා රසඥතා වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	5	3,112,307.00	62.25%	√			ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් තෝරාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ අවම මිල ගණන් යටතේ භාණ්ඩ සම්පාදනය වීම හේතුවෙන් මෙම මුදල් ඉතිරි විය. රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය යටතේ ඉතිරි වූ මුදල් සඳහා විකල්ප වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
දඹාන ජන උරුම මධ්‍යස්ථානය නඩත්තු කිරීම.	2	1,651,080.00	82.55%		√		ආදිවාසි දිනය නිමිත්තෙන් පැවැත්වීමට නියමිතව තිබූ ආදිවාසී දින සැමරුම් උත්සවය පැවති covid 19 තත්ත්වය හමුවේ සිදු කිරීමට නොහැකි වීම.
ග්‍රාමීය කලා ගම්මාන - ප්‍රසිද්ධ කලාකරුවන් ආශ්‍රය කරගත් කලා ගම්මාන නිර්මාණය කිරීම.	10	9,043,228.40	90.43%	√			මෙය අඛණ්ඩව සිදුවන ව්‍යාපෘතියකි. 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.
දේශීයත්වය මුල් කරගත් කර්තෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යන්ත්‍රණයක් හඳුන්වා දීම.	2	5,622.20	0.28%				ව්‍යාපෘතියේ ප්‍රධානම කාර්යය වන සාමූහික සංගම් පිහිටුවීම, රටේ පැවති කොවිඩ් වසංගතය හමුවේ ක්‍රමවත් අයුරින් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා සාමූහික සංගම් පිහිටුවීම සඳහා වෙන්කොට තිබූ ප්‍රතිපාදන ඉතිරි විය.
කලාකරුවන් සඳහා හදිසි අනතුරු හා වෛද්‍යාධාර රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම.	10	9,974,715.00	99.75%	√			මෙය අඛණ්ඩව සිදුවන ව්‍යාපෘතියකි. 2021 වර්ෂයේ දී කලාකරුවන් 550 ට රක්ෂණාවරණ ප්‍රදානය කරන ලදි.
කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම හා යාවත්කාලීන කිරීම.	7	6,539,825.00	93.43%		√		මෙය අඛණ්ඩව සිදුවන ව්‍යාපෘතියකි. 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.

පරිච්ඡේදය 06

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

6.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක	අරමුණ /ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
(11.4.) ලෝකයේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීමට සහ ආරක්ෂා කිරීමට දරන උත්සාහයන් ශක්තිමත් කිරීම.	1.**ජාතික උරුම පර්යේෂණ හා සංරක්ෂණ ඒකකයක් ස්ථාපනය කිරීම (ජාතික උරුම හඳුනා ගැනීම)**	ජාතික හා ප්‍රාදේශීය මට්ටමෙන් ජා. උරුමයන් හඳුනා ගැනීම, සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම.		√	
	2. **ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම.** 2.1. ඩිජිටල් යෙදවුමට ඇතුළත් කිරීම සඳහා ජාතික උරුම සංරක්ෂණ වීඩියෝ නිෂ්පාදන කිරීම	වීඩියෝ පට 30 ක් නිෂ්පාදනය කිරීම.			√
	3. ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම. 3.1.රතුගල ආදිවාසී ගම්මානයේ ආදිවාසී ළමුන් සඳහා ආදිවාසී භාෂාව ඉගැන්වීමේ වැඩ සටහනක් ආරම්භ කිරීම.	පළමු අදියර යටතේ ළමුන් 50 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් මේ සඳහා			√
	3.2.දඹාන ජන උරුම කේන්ද්‍රයේ Kiosk Information System ස්ථාපනය කිරීම.	කාර්යය නිම කිරීම.			√
	3.3. ආදිවාසී ගම්මානවල ආරක්ෂණ සේවාවන් යටතේ දඹාන හා හේනානිගල ආදිවාසී ගම්මාන වල වහලයන් ඉළුක් යොදා වහල අලුත්වැඩියා කිරීම.	කාර්යය නිම කිරීම.			√

ඉලක්ක	අරමුණු/ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% - 74%	75% - 100%
(11.4.)ලෝකයේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීමට සහ ආරක්ෂා කිරීමට දරන උත්සාහයන් ශක්තිමත් කිරීම.	**4. දැයේ උරුමය දරුවන්ටයි දැනුවත් කිරීමේ වැඩසටහන** 4.1.මෙම ව්‍යාපෘතිය යටතේ සමස්ත දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් පිරිවෙන් 102 ක් එම පිරිවෙන්වල ඉගෙන ගන්නා දරුවන් හේවිසි වාදනය සඳහා පුහුණු කිරීම ද මේ මඟින් සිදු කෙරේ.	සිසුන් 612ක්			√
	5.දරුවන්ගේ කලා රසඥතාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. 5.1.මෙම ව්‍යාපෘතිය යටතේ සමස්ත දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් පිරිවෙන් 102 ක් සඳහා හේවිසි වාදන භාණ්ඩ කට්ටල ලබා දීම.				√
	5.2. දහම් පාසල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමාගේ ඉල්ලීමට අනුව දැනට නර්තන විෂය උගන්වන පිරිවෙන් සඳහා ගැට බෙර බෙදා දීම.	ගැට බෙර 58ක් බෙදා දීම.			√
	6. දඹාන ජන උරුම මධ්‍යස්ථානය නඩත්තු කිරීම.	මධ්‍යස්ථානය			√
	7.ආදී වාසි ජන උරුමයන් ආරක්ෂා කිරීම	දඹාන ජන උරුම කේන්ද්‍රයේ අස්ථි ප්‍රදර්ශන මැදිරියක් ස්ථාපිත කිරීම.			√
	8.ප්‍රසිද්ධ කලාකරුවන් ආශ්‍රය කරගත් කලා ගම්මාන නිර්මාණය කිරීම. 8.1.මෙම ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රවීන කලාකරුවකු වන ආර්.ජී.එච්.එස් රත්න කුමාර මහතා වෙනුවෙන් දුටුවැව මහා විද්‍යාලයේ සෞන්දර්යය ඒකකය ස්ථාපනය කිරීම.	කාර්ය අවසන් කර ඇත.			√

ඉලක්ක	අරමුණු/ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
(11.4.)ලෝකයේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීමට සහ ආරක්ෂා කිරීමට දරන උත්සාහයන් ශක්තිමත් කිරීම.	8.2.කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රවීන කලාකරුවෙකු වන නැට්ටුක්කාර නැකතිගේ සේදරමන් ප්‍රනාන්දු මහතා වෙනුවෙන් හඳපාන්ගොඩ ග්‍රාමීය කලාගාරයක් නිර්මාණය කිරීම.				√
	9.දේශීයත්වය මුල් කර ගත් කර්තෘ භාග ගෙවීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යන්ත්‍රණයක් හඳුන්වා දීම.	විධිමත් යන්ත්‍රනයක් ස්ථාපනය කිරීම.	√		
	10.කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම හා යාවත්කාලීන කිරීම. 10.1අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම අවසන් කර ඇති අතර www.heritage.gov.lk කලාකරුවන්ගේ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම හා යාවත්කාලීන කිරීම.	කලාකරුවන්ගේ දත්ත පද්ධතියට ඇතුළත් කිරීම.			√
	10.2. කලාකරුවන් හා සේවාලාභීන් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධීකරණය කෙරෙන සැපයුම් ජාලයක් ලෙස කලාකරු ඩිජිටල් යෙදුම (Artist Digital App) නිර්මාණය කිරීම.				√
	11. කලාකරුවන් සඳහා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.	පළමු අදියර යටතේ කලාකරුවන් 550 ක් සඳහා රක්ෂණ ඔප්පු ප්‍රදානය.			√
	12. කන්ද උඩරට ජාතික උරුමය සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම 12.1. ශ්‍රී ලංකාවේ ඉපැරණි ලේඛන කලාව පිළිබඳ අධ්‍යයනය හා සංරක්ෂණය උදෙසා අතීතයේ ලිය වී ඇති පුස්කොළ පොත් සංගණනයන් කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම.	විහාරස්ථානය 01ක් සහ පිරිවෙන් 04ක්			√

ඉලක්ක	අරමුණු/ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
(11.4.)ලෝකයේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීමට සහ ආරක්ෂා කිරීමට දරන උත්සාහයන් ශක්තිමත් කිරීම.	12.2. ඌව කෞතුකාගාරය නවීකරණය කිරීම.	කෞතුකාගාර 01ක්			√
	12.3. පුරාණ විහරස්ථානවල බිතු සිතුවම් නඩත්තුව සහ සංරක්ෂණය කිරීම.	හිඳගල රජමහා විහාරස්ථානය.			√
	12.4. ඇහැලේපොළ පුරාණ විහාරස්ථානයේ පිහිටි මාතලේ විරුවන් අනුස්මරණ ශාලාවෙහි ඉතිරි වැඩ නිම කිරීම.	අදියර 01 සහ අදියර 02			√
	12.5.ආයතනයේ සහ බල ප්‍රදේශයේ තෝරාගත් දහම් පාසල් හි පුස්තකාල සඳහා ග්‍රන්ථ බෙදා දීම.				√
	12.6. කන්ද උඩරට උරුමය ආශ්‍රිතව ලේඛක අත්වැල වැඩසටහන ක්‍රියාත්මක කිරීම.	පොත් ප්‍රමාණය 18778 ක්			√
	12.7. මධ්‍යම පළාතේ සක්‍රීය නර්තන කලායතන සඳහා කලා භාණ්ඩ ලබාදීම.	කලා ආයතන 25			√
	12.8. හේවිසි වාදන ක්‍රම සංරක්ෂණය කිරීම	සංයුක්ත තැටි 300ක්			√
	12.9. ඌව පරණගම, කොරදේකුඹුර ගම්මානය අංගම්පොර සටන් කලාව සංරක්ෂිත ගම්මානයක් ලෙස වැඩිදියුණු කිරීම හා අංගම්පොර සටන් කලාව ප්‍රවර්ධනය කිරීම.	ගම්මාන			√
	12.10.හෙළ ජන නාද උරුමය.	ප්‍රමුඛත්වය මත ජන සංගීතාංග 10 ට අයත් ජන සංගීත 20 ක්			√
	12.11. පුරාණ සාම්ප්‍රදායික ශාන්ති කර්මයක්/ ජන ඇදහිලි/ සංග්‍රහ විධි/ වාරිත්‍ර වාරිත්‍ර සංරක්ෂණය කිරීම - (දේව විශ්කම් බලි ශාන්තිකර්මය රහ දැක්වීම හා සංරක්ෂණය කිරීම)				√
	12.12 “සිතුවම් හා ප්‍රතිමා නිර්මාණ ශාස්ත්‍ර විධි” මුද්‍රණය කිරීම.				√

ඉලක්ක	අරමුණු/ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
SDG 8. තිරසාර සංවර්ධනය සඳහා තිරසාර ආර්ථික වර්ධනයක් හා සළුලදායි රැකියා සහ සැමට යහපත් වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම	**13.රන්මිහිතැන්න ටෙලී සිනමා උද්‍යානය නවිකරණය කිරීම.** **13.1.ප්‍රවර්ධන කටයුතු-**නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම				√
SDG 9 ධරණීය යටිතල පහසුකම් ගොඩ නැගීම, සංයුක්ත සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නළාවුකරණයන් පෝෂණය කිරීම.	**13.2.යටිතල පහසුකම් සංවර්ධනය-** ගම්මානය වැඩි දියුණු කිරීම. චිත්‍රාගාරය ප්‍රතිසංස්කරණය කිරීම. දර්ශන පසුතල අලුත්වැඩියාව (නිපෝන් හෝටලය, බැංකු ගොඩනැගිල්ල, කාර්ගිල්ස් ගොඩනැගිල්ල)				√
	ජම්බුගස්වැව ප්‍රතිසංස්කරණය **-අදියර-1**				√
(4) පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	**14. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ පාඨමාලාවන්හි ගුණාත්මක බවය වැඩි කිරීම සහ නව පාඨමාලා හඳුන්වා දීම.** 14.1සියලුම පාඨමාලාවන්හි ප්‍රතීතන කටයුතු අවසන් කිරීම.	ගුණාත්මක බවය සහ පාඨමාලා සංඛ්‍යාව		√	
	14.1.1. අදාළ විෂය නිර්දේශය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) ආයතනය මඟින් වලංගු (Validate) කර ගැනීම් කටයුතු සිදු කිරීම.			√	
	14.1.2.තෘතියික හා වෘත්තීය **අධ්‍යාපන කොමිෂන් සභාව** (TVEC) ආයතනය හරහා ප්‍රතීතන කටයුතු අවසන් කිරීම.			√	
	14.1.නව පාඨමාලාවක් ලෙස පන්සල් චිත්‍ර සංරක්ෂණ කෙටිකාලීන පාඨමාලාවක් ආරම්භ කිරීම.				√

	14.2. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය සතු ගොඩනැගිලි නවීකරණය කිරීම. 14.2.1. කාන්තා නේවාසිකාගාරයේ ස්ථානයේ සිදු කරනු ලබන ස්ථාන ආවරණය කිරීම හා මැද මිදුල්වල අන්තර් සම්බන්ධිත කුට්ගල් ඇති කිරීම.	ගොඩනැගිලි			√
	14.2.2. ශිෂ්‍ය නේවාසිකාගාරවල සහ කාර්යාල පහසුකම් වැඩි දියුණු කිරීම.				√
	14.2.3.පිරිමි නේවාසිකාගාරයේ මුළුතැන්ගෙය නවීකරණය කිරීම.				√
	14.2.4. සංගීත අධ්‍යයන ගොඩනැගිල්ල සහ නිල නිවස නවීකරණය කිරීම.				√

6.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජාතික උරුම හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම සඳහා වන දිගුකාලීන අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වීමට විශේෂිත වූ ක්‍රමවේදයක් නොමැති වීම මෙම ක්ෂේත්‍රය තුළ පැවති විශාල හිඩැසකි. මෙම තත්වයට තිරසාර විසඳුමක් වශයෙන් පර්යේෂණ හා සංරක්ෂණ ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා වන යෝජනා හා නිර්දේශ ලබා ගැනීමට පත් කරන ලද විද්වත් කමිටුව විසින් සකස් කරන ලද වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට හැකි වීම විශාල ජයග්‍රහණයකි. ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වා දීම මගින් ශ්‍රී ලංකාවේ ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය (Tangible & Intangible) ජාතික උරුම දේශීය හා විදේශීය ප්‍රජාව වෙත වඩාත් ආකර්ෂණීය හා ඵලදායි ලෙස සන්නිවේදනය කිරීම තුළින් ජාතික උරුම ආරක්ෂා කිරීමේ උත්සහායන් ශක්තිමත් කිරීමේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට හැකිවීම විශේෂ ජයග්‍රහණයකි.

සියලුම කලා ක්ෂේත්‍ර හා කලා ශිල්ප ආවරණය වන පරිදි දිවයිනේ විවිධ ප්‍රදේශවල විසිරී සිටින කලාකරුවන්ගේ අංග සම්පූර්ණ තොරතුරු ඇතුළත් කළ හැකි දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම, කලාකරුවන්ට හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම, ප්‍රසිද්ධ කලාකරුවන් ආශ්‍රය කරගත් ග්‍රාමීය කලා ගම්මාන නිර්මාණය කිරීම, දඹාන ජන උරුම කේන්ද්‍රයේ අස්ථි ප්‍රදර්ශන මැදිරිය ස්ථාපිත කිරීම, රතුගල ආදිවාසි ගම්මානයේ ආදිවාසි ළමුන් සඳහා ආදිවාසි භාෂාව ඉගැන්වීමේ වැනි වැඩසටහන් මගින් ජාතික උරුම ක්ෂේත්‍රයන්ට අදාල තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කිරීමේ මාවතට අමාත්‍යාංශ වැඩසටහන් ප්‍රවේශ වී ඇත.

අභිනව අමාත්‍යාංශය 2020 වර්ෂයේ අග භාගයේ දී ස්ථාපිත කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශයට අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත් හිහය ප්‍රබල අභියෝගයක් ව තිබුණි. 2021 වර්ෂය පුරාවට අමාත්‍යාංශයේ කාර්යයන්ගේ සියයට අසූවක් පමණ ඉටු කරවා ගැනීමට සිදු වූයේ අභ්‍යාසලාභී (පුහුණු) උපාධිධාරීන්ගෙනි. එම තත්වය විශේෂයෙන්ම අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානම අභියෝගය බවට පත් විය.

අමාත්‍යාංශයට 2021 වර්ෂය සඳහා වෙන් වී තිබූ ඉතාම සීමිත ප්‍රතිපාදනය උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද රට තුළ ඇති වූ කොරෝනා වෛරස් තත්ත්වය හේතුවෙන් වරින් වර අමාත්‍යාංශය වසා තැබීම හා රජය විසින් පනවන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශනයට යටත් ව කටයුතු කිරීමට සිදු වීම නිසා 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සියයට සියයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවද පැවති තත්වයට සාපේක්ෂව සෑහීමකට පත් විය හැකිය.

පරිච්ඡේදය 07

මානව සම්පත් පැතිකඩ

7.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 2021.12.31 දිනට

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	09	06	03
තෘතීයික	01	00	01
ද්විතියික	38	18	20
ප්‍රාථමික	10	02	08

7.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපානු ලැබ ඇති ආකාරය.

- අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව පවතින සේවක සංඛ්‍යාව ප්‍රමාණාත්මකව ඉතා අඩු බැවින් එක් සේවකයකුට දැරීමට සිදු වන වැඩ ප්‍රමාණය අධික වීම.
- ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අනුමත පරිදි නොමැති වීම නිසා ආයතනයේ පරිපාලන කටයුතු මනා අධීක්ෂණයකින් යුතුව, නියමිත වේලාවට, ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කිරීමට අපහසු වීම.

7.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු - 2021

අනු අංකය	පුහුණු වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කලසීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්)	නිමැවුම / ලබාගත් දැනුම
01	අභ්‍යාසලාභීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන	45	2021.01.06-2021.01.15	රු.28 250/=	කාර්යාල ක්‍රම හා රාජ්‍ය සේවය මූලික දැනුම
02	කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන වැඩසටහන	61	2021.02.20	රු. 67847/=	නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය හා ආයතනය සම්බන්ධ මූලික ගැටළු හා විසඳුම්
03	පාලන අංශයට අදාළ පෞද්ගලික ලිපි ගොනු සැලසීම	03	2021.05.13-14	රු.4200/=	

අනු අංකය	පුහුණු වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කලසීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්)	නිමැවුම / ලබාගත් දැනුම
04	අමාත්‍ය කාර්යය මණ්ඩලය සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන	60	2021.10./13 /15	රු.11960/=	නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය
05	අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක ආයතන සඳහා ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන - මාණ්ඩලික නිලධාරින්	50	2021.11.03	රු. 51205/=	ආයතන මාණ්ඩලික නිලධාරීන් සඳහා ආයතන සංවර්ධන වැඩසටහන.
06	මාර්ගගත ලෙස පෞද්ගලික ලිපි ගොනු පුහුණු වැඩසටහන	02	2021.12.01. /02/03	රු.10000/=	

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වීම.

08 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	නව අමාත්‍යාංශයක් වූ බැවින්,අභ්‍යන්තර විගණන අංශයක් නොතිබූ බැවින්, අභ්‍යන්තර විගණන සැලැස්මක් නොතිබුණි.	2022 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලස්මක් ක්‍රියාත්මක වේ.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල	අනුකූල වේ		

	පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	2021 වර්ෂයේ පැවති මානව සම්පත් හිඟය හේතුවෙන් අතපසු වී ඇත	මෙම වර්ෂයේ සිට අදාළ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබේ.
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාළ නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ		මෙම වර්ෂයේ සිට අදාළ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබේ.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල නොවේ	CBG/1591 වාහනයේ වාරික ගෙවීම් මේ වන විට අවසන්ව නැත.	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අදාළ නොවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබී	අදාළ නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල නොවේ	නව අමාත්‍යාංශයක් වූ බැවින් නිල වෙබ් අඩවියක් නොතිබිණි.මේ වන විට නිල වෙබ් අඩවියක් සකස් කර ඇති අතර සංවර්ධන කටයුතු සිදු විය.	නිල වෙබ් අඩවිය සංවර්ධන කටයුතු අවසන් වූ වහාම මේ සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කෙරේ.

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	තොරතුරු පනතට අදාළ ඉල්ලීම් ලැබී නැත	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		